මාර්ග සංවර්ධන අධිකාරිය- 2024

-------------------------------------

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 අහිතකර මතය

මාර්ග සංවර්ධන අධිකාරියේ ("අධිකාරිය") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒවායේ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව අහිතකර මතයක් ප්‍රකාශ කරමි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 07 ඡේදය අනුව ගනුදෙනු හා සිද්ධීන් ඒවා අදාළ වන කාලපරිච්ඡේදය තුල මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගැනීම හා වාර්තා කිරීම් සිදුකළ යුතු වුවත්, 2023 වර්ෂයට අදාළව 2024 ජනවාරි 08 දින රාජ්‍ය බැංකුවක් වෙත ගෙවූ රු.මිලියන 5.97 ක දඩ මුදල සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්තබා තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් සටහන් වී තිබුණි. තවද, උක්ත ප්‍රමිතයේ 107 (ඊ) ඡේදයට අනුකූලව මෙම දඩ මුදල් ගෙවීම පිළිබඳ මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව්කර නොතිබුණි. | මෙම දඩ මුදල් ගෙවීමට සිදු වූයේ මහා භාණ්ඩාගාරයෙන් අදාළ අක්මුදල් ලැබීමට ප්‍රමාද වීම නිසා වන අතර දඩ මුදල අය නොකර ගන්නා ලෙස බැංකුව සමඟ දිගින් දිගටම සාක්ච්ඡා පැවැත් වූ බැවින් 2023 වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත නොකරන ලද අතර සාකච්ඡා අසාර්ථක වූ බැවින් 2024 වර්ෂයේදී එම දඩ මුදල ගෙවීමට සිදු වි ඇත. | අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් සහතික විය යුතු අතර ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුලින් මෙය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අධිකාරිය විසින්, මහා භාණ්ඩාගාරය විසින් අනුමත කර තිබූ රු. මිලියන 581,000 ක ණය සීමාව හා භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන සහනදායී ලිපි (letter of comfort) යටතේ අධිකාරියේ ස්ථාවර තැන්පතු ඇපයට තබා ලබා ගත් ණය මුදලින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට දේශීය වාණිජ බැංකු 05 ක් වෙත ගෙවීමට පැවති රු.මිලියන 233,054 ක ණය හා රු.මිලියන 88,515 ක ණයකර ශේෂ සම්බන්ධ | ණයකර නිකුත් කිරීම සිදු වූයේ 2021 වර්ෂයේ වන අතර ණයකර නිකුත් කිරීමට අදාළව ඉදිකළ මාර්ග පිළිබඳව වර්ගීකරණ මාර්ග ලැයිස්තුව 2021.12.31 වන දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය තුල හෙළිදරව් කර ඇත. තවද ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2.6 , a හා b හි ණය ගැනුම් පිරිවැය ප්‍රාග්ධනිත කරන ආකාරය හෙළිදරව් කර ඇති අතර ප්‍රමිත අංක 04 හි 18, 19, 20, 31,32,33 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) ඇ වගන්තිය යටතේ වූ පද්ධති සමාලොචනයේදී මේ පිළිබඳ විශේෂ අවධානයක් සහිතව වගකීම් නිශ්චය කර අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා ලිඛිත උපදෙස් නිකුත් කර අධීක්ෂණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | උපලේඛණ පිලියෙළ කිරීම හා උක්ත ණය ගැනීම් භාවිතා කළ ආකාරය, එම ණය ආයෝජනය කර ඉදිකරන ලද මාර්ග පිලිබඳ තොරතුරු හා ණය ලබා ගත් මුලාශ්‍ර, දිනය, ණය මුදල, එක් එක් මාර්ගය සඳහා ප්‍රාග්ධනිත කළ ණය ගැණුම් පිරිවැය, ඇපකර, සහන කාලය, ආපසු ගෙවීමේ කාලය, ණය ප්‍රතිව්‍යුහගත කිරීම්, ණය වාරික ගෙවීම්, පොලී ගෙවීම් ආදී තොරතුරු ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 15 හා 16 වගන්තීන් හා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 04 හි 18, 19, 20, 31, 32, 33, 34, 36 හා 40 ඡේදයන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශනයන්හි හෙළිදරව් කර නොතිබුණි. | අනුව ණය ගැනුම් පිරිවැය වත්කමේ පිරිවැයෙහි කොටසක් ලෙස ප්‍රාග්ධනිත කර ඇති අතර 36 වන වගන්තියට අනුව අදාළ වත්කම භාවිතයේදී ප්‍රාග්ධනිත කිරීම නතර කර ඇත. ඔබ විසින් ඉල්ලා ඇති පරිදි ණය සම්බන්ධයෙන් වන ලේඛන යාවත්කාලීන කර පවත්වාගෙන යෑමට කටයුතු කරනු ඇත. | |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 16 (ආ) ඡේදය අනුව ව්‍යාවස්ථාදායක අධිකාරීන් විසින් ස්ථාපිත කර ඇති මූල්‍ය සීමා සහිතව, නෛතික හා ගිවිසුම්ගත අවශ්‍යතාවයන්ට අනුකූලව සම්පත් ලබා ගන්නා ලද්දේ ද සහ භාවිතා කරන ලද්දේ ද යන්න මූල්‍ය ප්‍රකාශන තුළ නිරූපණය කළ යුතුය. එනමුත්, මාර්ග නඩත්තු කටයුතු සඳහා රේඛීය අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී ලබා දී තිබූ රු.මිලියන 20,749 ක ප්‍රතිපාදන වලින් රු.මිලියන 84.6 ක් බාහිර ආයතන විසින් නඩත්තු කටයුතු සඳහා මුදල් තැන්පත්කර තිබූ මාර්ග 43 ක් වෙනුවෙන් වැය කර තිබුණද, එම මුදල රේඛීය අමාත්‍යාංශය වෙත ප්‍රතිපූර්ණයකළ යුතු මුදල් ලෙස ගිණුම් ගත නොකර සේවාදායක ආදායමක් ලෙස ගිණුම් තැබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය අධිගණනය වී තිබුණි. | අදාළ වටිනාකම සේවා දායක ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබූ හෙයින් සේවාදායක තැන්පතු වටිනාකම වැඩියෙන් සටහන් කර නොමැත. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු අතර ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් වැරදි නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මාර්ග සංවර්ධන අධිකාරියේ නිත්‍ය විෂය පථයට ඇතුළත් නොවන මාර්ග කිලෝමීටර් 100,000 ක විකල්ප මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ග්‍රාමීය මාර්ග සංවර්ධනය සඳහා රේඛීය අමාත්‍යාංශය මගින් අධිකාරියට ලද ප්‍රතිපාදන සහ ඊට අදාළ වියදම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 15 හා 16 ඡේදයන්ට අනුකූලව වෙනම ව්‍යාපෘති ගිණුමක සටහන් නොකර අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළම සටහන් කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් සහ වත්කම් හා පෙර වර්ෂ ආදායම් සහ වත්කම් පිළිවෙලින් රු. මිලියන 25,537.47 ක් හා රු.මිලියන 155,703.94 ක් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි. | කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිව 2020 සිට ක්‍රියාත්මක සෞභාග්‍යයේ දැක්ම සංවර්ධන වැඩසටහනක් මගින් අධිකාරියේ විෂය පථයට ඇතුළත් නොවන මාර්ගද ඉදිකිරීමට හා සංවර්ධනය කිරීමට සිදු විය. කැබිනට් මණ්ඩල අනුමැතිය මගින් ක්‍රියාකාරී ආයතනය ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය වෙත වගකීම පවරා මේ වන විට නීත්‍යානුකූලව සම්මත කර ගන්නා ලද වැය ශීර්ෂයකින් මුදල් වෙන් කිරීම සිදු කරන අතර එම මුදල් සෘජුව රේඛීය අමාත්‍යාංශය විසින් අධිකාරිය වෙත නිදහස් කර ඉන්පසු අධිකාරිය හරහා ව්‍යාපෘතිය වෙත මූල්‍ය සම්පාදන කිරීම දිගින් දිගටම සිදු වී ඇත. | ආදායම්, වියදම් හා වත්කම්, වගකීම් නිවැරදිව ගිණුම් ගත කළ යුතු අතර ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 49 ඡේදයට පටහැනිව, සමාලෝචිත වර්ෂයේදී අධිවේගී මාර්ග පද්ධතියෙන් උපයන ලද රු.මිලියන 12,766.5 ක ආදායම් හා රු.මිලියන 7,534.85 ක මෙහෙයුම් වියදම් වෙන වෙනම ගිණුම්ගත නොකර ශුද්ධ ආදායම වූ රු.මිලියන 5,231.66 ක් පමණක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ සටහන් කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් නිරූපනය වී තිබුණි. | පසුගිය විගණන වාර්තා මගින් අධිවේගී මාර්ග පද්ධතියේ ශුද්ධ ආදායම වෙනමම ඛණ්ඩයක් ලෙස අනාවරණය කරන ලෙස දැන් වූ බැවින් ද ප්‍රමිත අංක 17 හි 66 වන වගන්තියේ සඳහන් පරිදි අධිවේගී මාර්ග පද්ධතිය වෙනමම ඛණ්ඩයක් ලෙස සලකා එහි ආදායම හා වියදම හිලව් කර ලාභය පමණක් ආදායම් ප්‍රකාශනයට 2021 වසරේ සිට ගලපා ඇත. | ආදායම්, වියදම් හා වත්කම්, වගකීම් නිවැරදිව ගිණුම් ගත කළ යුතු අතර ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2020 පෙබරවාරි 05 දිනැති අංක අමප/20/0313/204/029 හා 2020 ජුනි මස 24 දිනැති අංක අමප/20/0974/204/029 - VI දරන අමාත්‍ය මණ්ඩල තීරණයන්ට අනුව ණය මුදල් වලට අදාළ පොලී වියදම් සහ අනෙකුත් පිරිවැයන් පියවීම සඳහා හිමිකම් දායකත්ව වශයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලබා දී තිබු ප්‍රතිපාදන එම තීරණයට හා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කර ප්‍රමිත අංක 01 හි 16 ඡේදයට පටහැනිව දේශීය බැංකු ණය පොලී හා වාරික | SLPSAS 11 අනුව ප්‍රදාන ලැබීම් ගිණුම් තැබීම සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් පැන නගින නිසා රජයේ හිමිකම් දායකත්වය ලෙස ගිණුම් තැබීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය හා රේඛීය අමාත්‍යාංශයෙන් අවශ්‍ය උපදෙස් ලබා ගෙන ඉදිරියේදී කටයුතු කරනු ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) ඇ වගන්තිය යටතේ වූ පද්ධති සමාලෝචනයේදී සාවද්‍ය මූල්‍ය වාර්තාකරණය වැළකෙන පරිදි විශේෂ අවධානයක් සහිතව වගකීම් නිශ්චය කර අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා ලිඛිත උපදෙස් නිකුත් කර අධීක්ෂණය කළයුතු අතර ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුලින් අවශ්‍ය නිවැරදි කිරීම් |

| | | | |
|---|---|---|---|
| | ගෙවීම සඳහා රේඛීය අමාත්‍යාංශය මගින් ලබා දී තිබුණු ප්‍රතිපාදන මගින් සමාලෝචිත වර්ෂයේදී වැය කළ රු.මිලියන 48,195 ක් හා 2021, 2022 හා 2023 වර්ෂයන්හිදී වැයකර තිබූ රු.මිලියන 137,271.96 ක් ඇතුළුව රු.මිලියන 185,466.96 ක් ප්‍රාග්ධන ප්‍රදාන (Capital contribution) ලෙස වාර්ෂික ආදායම් යටතේ ගිණුම් තැබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ අතිරික්තය පිළිවෙලින් රු.මිලියන 48,195 ක් හා රු.මිලියන 137,271.96 ක් වැඩියෙන්ද හිමිකම් දායකත්වය එම වටිනාකමින් අඩුවෙන්ද සටහන් වී තිබුණි. | | කළ යුතුය. |
| (උ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි 39 ඡේදය අනුව විදේශ විනිමය අනුපාතයන් වෙනස් වීම් නිසා ඇතිවන උපලබ්ධි නොවූ ලාභ සහ අලාභ මුදල් කාල පරිච්ඡේදයේ මුල හා අග මුදල් හා මුදල් සමාන දෑ සංසන්දනය කිරීම යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළ රු.මිලියන 358 ක් වූ විනිමය ලාභය සමාලෝචිත වර්ෂයේ අතිරික්තයට සිදු කරන ගැලපීම් යටතේ රු.මිලියන 375.8 ක් ලෙස අඩු කිරීම හේතුවෙන් මෙහෙයුම් කටුයුතු වලින් ලද මුදල් ප්‍රවාහය රු.මිලියන 17.72 ක් අඩුවෙන් හා වර්ෂ අවසාන මුදල් වටිනාකම රු.මිලියන 358 ක් අඩුවෙන් සටහන් කර තිබුණි. තවද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 15 (ආ) වගන්තියෙහි සඳහන් අවශ්‍යතාවයන්ට පටහැනිව, සමාලෝචිත වර්ෂයේදී මුදලින් දරන ලද රු.මිලියන 32.74 ක් වූ කෙරීගෙන යන වැඩ විටිනාකම සහ මිලදී ගත් එකතුව රු.මිලියන 6,691.56 ක් වූ දේපල පිරියත උපකරණ වටිනාකම මූල්‍යනය කරන ලද මූලාශ්‍ර පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් නොකිරීම හේතුවෙන් උක්ත සඳහන් මෙහෙයුම් කටයුතු වල මුදල් | ප්‍රමිත අංක 02 හි 39 පරිදි විනිමය අනුපාතයන් වෙනස් වීමෙහි වන බලපෑම කාලච්ඡේදයේ මුදල් හා මුදල් සමාන දෑ සන්සන්දය කිරීම පිණිස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කරන බවද එය මෙහෙයුම්, ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ඇති වන මුදල් ප්‍රවාහයන්ගෙන් වෙන් කොට ඉදිරිපත් කරන බවද දැක්වේ. එම නිසා අදාළ ගැලපීම සිදු කිරීමට උචිත ස්ථානය වන්නේ අතිරික්තයට සිදු වන බලපෑම යටතේ වන හෙයින් එලෙස ගලපා ඇති අතර එසේ නොවන්නේ නම් කාලච්ඡේදයේ මුදල් හා මුදල් සමාන දෑ යටතට ගැලපූ විට මුදල් හා බැංකුව සමඟ තුලනය නොවන බව දන්වමි. එසේම කෙරීගෙන යන වැඩ (උපලේඛන අංක 193 සිට 226), අධිකාරියේ අරමුදල් වලින් මිලදීගත් දේපළ පිරියත වටිනාකම (උපලේඛන අංක 453 A), දේශීය අරමුදල් වලින් මිලදී ගනු ලැබූ දේපළ පිරියත වටිනාකම (උපලේඛන අංක 453 C) පිළිබඳ විස්තර මේ වන විටත් ඉදිරිපත් කර ඇත. | රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිවැරදිව සකස් කළ යුතු අතර විගණනයට අවශ්‍ය තොරතුරු නොපමාව ලබා දීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රවාහයේ සිදු වූ වෙනස්කම් තහවුරු කර ගත නොහැකි විය. | | |
| (ඌ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 04 හි 19 ඡේදයට අනුව, සුදුසුකම් ලබන වත්කමක් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි ණය ගැනීමේ පිරිවැය එම වත්කමේ පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කළ යුතු වුවද, අධිකාරිය විසින් වාණිජ බැංකු මගින් ණය ලබාගෙන මධ්‍යම අධිවේගී මාර්ග I හා III කොටස් උප ව්‍යාපෘති 02 ක් වෙත පිළිවෙළින් ලබා දී තිබුණු රු.මිලියන 38,260 ක හා රු. මිලියන 8,738.66 ක ණය මුදලට අදාළව 2024 වර්ෂය තුළ දරන ලද රු. මිලියන 5,918 ක් ඇතුළුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට දරා තිබුණු රු.මිලියන 33,631 ක ණය ගැනුම් පිරිවැය, අධිකාරිය විසින් අදාළ ව්‍යාපෘති වෙත ලබාදුන් ප්‍රාග්ධන දායකත්වයක් ලෙස සටහන් නොකර කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම් තැබීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම වටිනාකමින් කෙරීගෙන යන වැඩ වටිනාකම වැඩියෙන්ද, ව්‍යාපෘති වෙනුවෙන් ප්‍රාග්ධන දායක වීම් වටිනාකම අඩුවෙන්ද සටහන් කර තිබු අතර යථෝක්ත ප්‍රමිතියේ අංක 40 (ඇ) ඡේදය අනුව ප්‍රාග්ධනිත කිරීම සඳහා සුදුසුකම් ලබන ණය ගැණුම් පිරිවැය නිර්ණය කිරීමට භාවිතා කළ ප්‍රාග්ධනගත කිරීමේ අනුපාතිකය, හෙළිදරවු කර නොතිබුණි. | අදාළ ණය මාර්ග සංවර්ධන අධිකාරිය නමින් ලබා ගෙන ඇති අතර ඒ සඳහා වන ණය වාරික හා පොළී ගෙවීමට මහා භාණ්ඩාගාරයෙන් අවශ්‍ය වන ප්‍රතිපාදන ලබා දෙයි. අධිකාරිය විසින් අදාළ ව්‍යාපෘති වලට ලබා දුන් ණය ප්‍රාග්ධන දායකත්වයන් ලෙස සටහන් කරන්නේ නම්, ණය මුදල පෙන්වනු ලබන්නේ අධිකාරියේ ගිණුම් තුල වන නිසා ණය මුදලේ අඩුවීම පෙන්වීම ව්‍යාපෘති ගිණුම් වාර්තාවන්හි සිදු කළ නොහැකි වනු ඇත. ඒ අනුව අධිවේගී මාර්ගය ප්‍රාග්ධනිත කරන තෙක් ප්‍රමිත අංක 04 හි වගන්ති 11 අනුව කෙරීගෙන යන වැඩ වටිනාකමට ණය ගැනුම් පිරිවැය ප්‍රාග්ධනිත කර ඇති අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශයෙන්ද ඒ පිළිබඳව තහවුරුවක් ලබා දී ඇත. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ණය ගැනුම් පිරිවැය ගිණුම්ගත කළ යුතු අතර ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඍ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 04 හි 34 වන වගන්තිය අනුව, දීර්ඝ කරන ලද කාලපරිච්ඡේද තුළදී, ක්‍රියාකාරි සංවර්ධන කටයුතු අතරමැද නවතා ඇති විටක ණය ගැණුම් පිරිවැය ප්‍රාග්ධනිත කිරීම අත්හිටුවිය යුතු වුවත්, අතරමැද නවතා තිබූ රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘති සහ මධ්‍යම අධිවේගී මාර්ග I කොටස ව්‍යාපෘතියට අදාළව | ප්‍රමිත අංක 04 හි 35 අනුව “වත්කමක් එහි අපේක්ෂිත පරිහරණය අවශ්‍ය තාවකාලික ප්‍රමාද කිරීමකදී ණය ගැනුම් පිරිවැය ප්‍රාග්ධනිත කිරීම අත්හිටුවනු නොලැබේ” යන ලෙස දක්වා ඇති නිසා හා ප්‍රමිතයේ 19 වන වගන්තියෙන් දක්වා ඇත්තේ වත්කම අත්පත් කර ගැනීමට සෘජුවම අදාළ කර ගත හැකි ණය | ණය ගැනුම් පිරිවැය ප්‍රමිතිය ප්‍රකාරව නිවැරදිව ගිණුම්ගත කළ යුතු අතර ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂයේ දරන ලද රු.මිලියන 4,839.29 ක ණය ගැනුම් පිරිවැය කාලපරිච්ඡේදයේ වියදමක් ලෙස හඳුනාගැනීමකින් තොරව, කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගතකර තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනයෙහි කෙරීගෙන යන වැඩ වටිනාකම හා අතිරික්තය එම අගයෙන් අධිගණනය වී තිබුණි. | ගැනුම් පිරිවැය ප්‍රාග්ධනිත කරන බව හා අනෙකුත් ණය ගැනුම් පිරිවැය වියදමක් ලෙස හඳුනා ගන්නා බවය. | |
| (ඌ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි ඡේද අංක 14 අනුව වත්කම් ලෙස හඳුනා ගත යුතු, අධිකාරිය භාවිතා කරනු ලබන සියළුම ගොඩනැගිලි මූල්‍ය ප්‍රකාශන වල සටහන්කර නොතිබූ අතර උක්ත ප්‍රමිතයේ 51 වගන්තියට පටහැනිව ගොඩනැගිලි 1134 ක වටිනාකම රු.මිලියන 11,840.02 ක් ලෙස ගිණුම්ගතකර තිබියදී, ගොඩනැගිලි 789 ක් පමණක් 2019 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කිරීම සඳහා හඳුනාගෙන එයින් ගොඩනැගිලි 561 ක් පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණි. තවද, තක්සේරුකළ ගොඩනැගිලි වල පිහිටීම, ප්‍රමාණය, අයිතියේ ස්වභාවය, වටිනාකම, තක්සේරු කළ දිනය, වර්ථමාන භාවිතය ආදී තොරතුරු ඇතුළත්කොට යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ගොඩනැගිලි ප්‍රත්‍යාගණන කටයුතු රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන අතර අදාළ තක්සේරු වටිනාකම් කඩිනමින් ගෙන්වා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින අතර 2025 වර්ෂය අවසන් වන විට නිම කිරීමට අපේක්ෂා කර ඇත. ස්ථාවර වත්කම් ලේඛනයේ තක්සේරු වටිනාකම, තක්සේරු කළ දිනය හා වර්තමාන භාවිතය සඳහන් වුවද ගොඩනැගිලිවල පිහිටීම, ප්‍රමාණය හා අයිතියේ ස්වභාවය ඇතුළත් කර ඒවා යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ඇත. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත් කාලීනව පවත්වා ගතයුතු අතර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතය ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම හෝ ගිණුම් ගත කිරීම නිවැරදිව සිදු කළ යුතුය. |
| (එ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 50 වගන්තියට පටහැනිව මූල්‍ය ප්‍රකාශනයේ මාර්ග වත්කම් ලෙස සටහන්කර තිබූ රු.මිලියන 381,641 ක වටිනාකම තුළ පිළිවෙලින් රු.මිලියන 214.74 ක් හා රු.මිලියන 1,328.34 ක් වූ ඉඩම් හා පාලම් වත්කම් වටිනාකම් ඇතුළත්කර තිබීම හේතුවෙන් ඊට සමාන වටිනාකමින් මාර්ග වත්කම අධි ගණනය කර ඉඩම් හා පාලම් වත්කම් වටිනාකම ඌන ගණනය කර තිබුණි. තවද, අදාළ ඉඩම් හා පාලම් වටිනාකම මාර්ග වත්කමක් ලෙස ක්ෂය කිරීම හේතුවෙන් වාර්ෂික | රු.මිලියන 1,328.34 මාර්ග වත්කමට අදාළ වන අතර ඒ ඉඩම් වටිනාකම ලෙස පොදු සටහන් අංක 10 හි පෙන්වීම, පරිගණක ගත කිරීමේදී ඇති ඇතිවූ දෝෂයක් වන අතර එය නිවැරදි කර ඇත. ඒ අනුව ඊට අදාළ ක්ෂය ගණනය නිවැරදි වන අතර ක්ෂය වියදම මාර්ග යටතේ රු.මිලියන 92.983 කින් අධිගණනය වී නොමැති අතර ඉඩම් වත්කම ඌන ගණනය වී නොමැත.<br>රු.මිලියන 214.748 සඳහා නිවැරදි කිරීම ජර්නල් අංක 160/J05 මඟින් 2025 වසරේදී නිවැරදි කිරීමට | ආදායම්, වියදම් හා වත්කම්, වගකීම් නිවැරදිව ගිණුම් ගත කළ යුතු අතර ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක්ෂය වියදම් රු.මිලියන 103.72 ක් වැඩියෙන් හා අදාළ වත්කම් වටිනාකම් අඩුවෙන් සටහන්කර තිබුණි. | කටයුතු කර ඇත. | |
| (ඒ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 58 වගන්තිය අනුව අස්ථිත්වයක් දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් සඳහා මුලින් හඳුනාගත් වටිනාකම එහි වැදගත් කොටස් වලට වෙන්කර ක්ෂය කළ යුතු වුවත්, අධිකාරියේ මුළු වත්කම් වලින් සියයට 82 ක් හෙවත් රු.මිලියන 1,140,180 ක් නියෝජනය කරන අධිවේගී මාර්ග පිරිවැය සහ ව්‍යාපෘති 04 ක් මගින් ඉදි කරන ලද මහාමාර්ග 42 කට අදාළ රු.මිලියන 71,982.01 ක් වූ පිරිවැය, බෝක්කු, පාලම්, පදික වේදිකාව, ආලෝකය සැපයීම් යනාදී වැදගත් කොටස් වලට වෙන්කර ක්ෂය නොකර, සියයට 03 ක පොදු අනුපාතයකින් ක්ෂය කිරීම හේතුවෙන් අධිවේගී හා මහාමාර්ග වත්කම් සහ ඊට අදාළ එකතුව රු.මිලියන 29,567 ක ක්ෂය වියදම් නිවැරදිව ගිණුම්ගතකර නොතිබුණි. | මාර්ග වත්කම් කළමනාකරණ අංශය මගින් මාර්ග වත්කම් තක්සේරුව (SLRAMS) පද්ධතිය හරහා සිදු කරනු ලබයි. එම තක්සේරු කිරීමේදී එක් එක් කොටස් වලට අදාළව වෙන වෙනම තක්සේරු අගයන් ලබාගෙන ඒ එක් එක් කොටස් වලට අදාළ විවිධ ක්ෂය අනුපාතයන් යටතේ ක්ෂය කිරීම සිදු කළ හැකි නිසා ඒ අනුව ඉදිරියේදී කටයුතු කරනු ඇත. | ගිණුම්කරන ප්‍රතිපත්ති වල සඳහන් ක්ෂය අනුපාතයන්ට අනුකූලව නිවැරදිව වත්කම් වර්ගීකරණය කර ක්ෂය කළ යුතු අතර අවශ්‍ය නිවැරදි කිරීම් ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ සිදු කළ යුතුය. |
| (ඓ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 87, 90 හා 92 ඡේදයන්ට අනුකූලව අයිතිය මත පැනවී ඇති සීමාවන් සහ වගකීම් සඳහා ආරක්ෂණයන් ලෙස ප්‍රතිඥා දී ඇති ස්ථාවර වත්කම් අගය, අත්පත්කර ගැනීම සඳහා වූ ගිවිසුම්ගත බැඳීම් ප්‍රමාණය, ප්‍රත්‍යාගණනය ක්‍රියාත්මක වන දිනයන්, තාවකාලිකව අක්‍රීයව ඇති දේපළ වල ධාරණ අගය, සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතාකරන වත්කම් වල ධාරණ අගය සහ ක්‍රියාකාරී භාවිතයෙන් විශ්‍රාම ගන්වා ඇති සහ බැහැර කිරීම සඳහා තබා ඇති සේ වර්ගීකරණය කළ වත්කම් පිළිබඳ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන මගින් සිදුකර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි ඡේද අංක 87, 90 සහ 92 වගන්තින්ට අනුකූලව කරනු ලබන හෙළිදරව් කිරීම් ඉදිරියේදී සිදුකිරීමට කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව වත්කම් සම්බන්ධවයන් හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන තුළ සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි ඡේද අංක 14 අනුව වත්කම් ලෙස හඳුනා ගත යුතු, අධිකාරිය සතු සමාලෝචිත වර්ෂය අවසන් වන විට භාවිතා කරනු ලබන සම්පූර්ණ මහා මාර්ග ප්‍රමාණය හා වටිනාකම එනම් මාර්ග සංවර්ධන අධිකාරියේ විෂය පථයට අයත් AA , AB, AC, B සහ E ශ්‍රේණි යටතේ මාර්ග කි.මී 12,568 ක් පවතින බව හඳුනාගෙන තිබූ නමුත් එයින් සියයට 29.71 කට සමාන මාර්ග කි.මී 3,734 ක වටිනාකම පමණක් රු.මිලියන 1,140,180 ක් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. 2016 වර්ෂයේ සිට විගණන වාර්තා මගින් මෙම කාරණය පෙන්වා දී තිබුණද, ඉතිරි මාර්ග කි.මී 8,834 ක වටිනාකම හඳුනාගෙන ප්‍රග්ධනිත කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | පැවති ප්‍රායෝගික දුෂ්කරතා හේතුවෙන් 2024 වසරේදී ප්‍රාග්ධනිත කිරීමට යෝජනා කර තිබූ කි.මී. 2000 ක ප්‍රමාණය සිදු කර ගත නොහැකි වූ අතර 2025 වසරේදී 2024 හා 2025 වසර වලට අදාළ ප්‍රමාණයන් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරනු ලැබේ. ආරම්භක පියවර ලෙස ඕනෑම මාර්ගයක ඉහළ වටිනාකමක් ඇති මාර්ග ව්‍යුහය හා පාදම වන බැවින් 2025 අවසන් වන විට කි.මී. 6000 ක මාර්ග ව්‍යුහය හා පාදම තක්සේරු කිරීමට ප්‍රමුඛතාවය දී ඇත. | වත්කම් සම්බන්ධ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට හා ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ වත්කම් ශේෂයන් නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |
| (ඕ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි ඡේද අංක 14 අනුව වත්කම් ලෙස හඳුනා ගත යුතු සහ ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කළ යුතු ඉදිකිරීම් ආරම්භ කිරීමකින් තොරව 2022 වර්ෂයේ දී අත්හැර දමා තිබූ මධ්‍යම අධිවේගී මාර්ග - IV කොටස ව්‍යාපෘතිය සඳහා අත්පත් කරගත් වටිනාකම රු. මිලියන 1,360.12 ක් වූ ඉඩම්, වර්ෂ 2021 සිට 2024 දක්වා කාලය තුළ කොන්ත්‍රාත් 23 ක් යටතේ නිමකර තිබූ වටිනාකම රු.මිලියන 706.94 ක් වූ මාර්ග, ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතිය මගින් 2023 දෙසැම්බර් 31 දින අධිකාරිය වෙත බාර දී තිබූ රු.මිලියන 916.41 ක් වූ වත්කම් සහ දක්ෂිණ අධිවේගී මාර්ග දීර්ඝ කිරීම් 3 කොටස ව්‍යාපෘතිය මගින් 2021 දෙසැම්බර් 31 දින අධිකාරිය වෙත බාර දී තිබූ රු.මිලියන 40.6 ක් වූ විද්‍යාගාර උපකරණද, ස්ථාවර වත්කම් ලේඛනයේ හා මූල්‍ය ප්‍රකාශන තුල ඇතුළත් කර නොතිබුණි. එසේම, ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් වූ එහෙත්, වටිනාකම හඳුනාගනු නොලැබූ වාහන 153ක්, විද්‍යාගාර | මෙම ව්‍යාපෘතිය 2025 ජූනි මස කැබිනට් මණ්ඩල තීරණ (අංක අමප/25/0892/809/068 හා 2025.06.17) අනුව නැවත ආරම්භ කිරීමට තීරණය වී ඇති අතර මෙතෙක් ඉඩම අත්පත් කර ගැනීම් සඳහා ගෙවන ලද මුදල ඉඩම් යටතේ හඳුනා නොගෙන නොනිමි වැඩ යටතේ ගිණුම් ගත කර ඇති බැවින් අදාළ නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. විද්‍යාගාර උපකරණ සහ පර්යේෂණ හා සංවර්ධන උපකරණ තක්සේරු කර තක්සේරු වටිනාකම් ලබා ගෙන මූල්‍ය වාර්තාවලට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. TPPF ව්‍යාපෘතියේ ඇවර ගිණුම් වලට අනුව මුළු වත්කම් රු.මිලියන 916.42 අතුරින් විදේශ ආධාර ව්‍යාපෘති වල විනිමය අනුපාත ගැලපීම වූ රු.මිලියන 428.47, රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ චක්‍ර ලේඛ 03/2024 අනුව ගැලපුම් කර ඉතිරි අගයෙන් රු.මිලියන 486.92 වටිනා උපදේශන සේවාවන් සඳහා වූ අගය 2025 ජනවාරි මස | වත්කම් සම්බන්ධ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට හා ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ වත්කම් ශේෂයන් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | උපකරණ 12,716 ක් හා පර්යේෂණ හා සංවර්ධන උපකරණ (R& D Equipments) 14,413 ක් මූල්‍ය ප්‍රකාශන වල වත්කම් ලෙස හඳුනා ගෙන නොතිබුණි. තවද, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ අධිකාරිය නමින් හා පෙර පැවැති දෙපාර්තමේන්තුව නමින් හෝ අධිකාරිය වෙත පවරන ලද RCDC ආයතනය නමින් හෝ ලියාපදිංචි වී නොමැති වාහන 71 ක්, අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන වත්කම් ලේඛනයෙහි ඇතුළත් වී නොමැති එහෙත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ අධිකාරිය නමින් ලියාපදිංචිව හා පෙර පැවති දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි වී ඇති වාහන 1206 ක් තිබුණි. | 199/J01 මඟින් ගිණුම් කර ඇත. මෙහි සඳහන් වාහන 153 න් දැනට පරිහරණය කරනු ලබන වාහන තක්සේරු වටිනාකම් මත ගිණුම්වල යාවත්කාලීන කිරීමට කටයුතු කරන අතර අනෙකුත් වාහන වලද හිමිකාරිත්වය තහවුරුකරගෙන වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත. | |
| (ඖ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 09 හි 15 ඡේදය ප්‍රකාරව තොගය පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට දැක්විය යුතු වුව ද, අධිකාරියේ අංශ 03 ක වර්ෂ අවසානයට පැවති තොග වටිනාකම ප්‍රමිතය අනුව අගය නොකර එහි පිරිවැය වටිනාකම වූ රු.මිලියන 286.89 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | මෙම තොගය මාර්ග සංවර්ධන අධිකාරියට ලද ප්‍රදානයක් වන අතර මිලදී ගත් තොගයක් නොවේ. මෙම තොගය දැනට භාවිතා කළ හැකි මට්ටමක පවතිද යන්න සහ නැවත තොග අගයන් ලබා ගැනීම පිළිබඳව සොයා බලා නිර්දේශ ඉදිරිපත් කිරීමට විශේෂ කමිටුවක් පත් කර ඇත. ඒ අනුව අදාළ හානි කරන වෙන්කිරීම් සිදු කරනු ඇත. | තොගයේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගයන් හඳුනාගෙන අඩු අගයට ගිණුම් ගත කළ යුතු අතර අවශ්‍ය නිවැරදි කිරීම් ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ සිදුකළ යුතුය. |
| (ක) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 හි අතිරේකය යටතේ ප්‍රාග්ධන ප්‍රදාන සටහන් කිරීම සඳහා ඉඩ දුන් විකල්ප ක්‍රමයට අනුකූල නොවන පරිදි සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන අතිරික්තය ගණනය කිරීමේ දී ප්‍රාග්ධන ප්‍රදාන රු.මිලියන 111.521 ක් ද ඇතුළත් කිරීම හේතුවෙන්, එම අගයෙන් පුනරාවර්තන අතිරික්තය හා ප්‍රාග්ධන ප්‍රදාන ඌනතාවය අධි ගණනය වී තිබුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 11 පරිදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා 2018 වර්ෂයේදී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සමඟ සාකච්ඡා කිරීමෙන් පසු දැනට භාවිතා කරනු ලබන ආකෘතිය නිර්මාණය කර ගත් අතර නැවත වරක් මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් තහවුරුවක් ලබා ගෙන අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත. | ප්‍රාග්ධන ප්‍රධාන ගිණුම් ගත කිරීමේ වරද නිවැරදි කිරීමට ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ සිදු කළ යුතුය. |
| (ඛ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 14 හි 27,28 සහ 34 ඡේද ප්‍රකාරව සම්බන්ධිත පාර්ශවයන්ගේ සම්බන්ධතා පිළිබඳ, එනම් ප්‍රධාන කළමනාකරණ පිරිසගේ එකිනෙක | මෙම හෙළිදරව් කිරීම ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රමිතය අනුව මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය හෙළිදරවු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පංතියෙහි විස්තර ඇතුළත් කරමින් ඔවුන්ගේ පාරිශ්‍රමික, වෙනත් දීමනා, මූල්‍ය නොවන ප්‍රතිලාභ හා පුද්ගලයින් ගණන, ව්‍යාපෘති කාර්යාල වෙත අනියුක්ත කර ඇති කළමනාකරුවන් ගණන හා වැටුප් හා දීමනා, අනුබද්ධිත සමාගම් අතර ගිවිසුම් හා ගණුදෙණු, මූල්‍යායනය සහ අතිරේඛ ඇප පිළිබඳ හෙළිදරව්කිරීම් මූල්‍ය ප්‍රකාශන තුල සිදුකර නොතිබුණි. | | |
| (ග) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 38 ඡේදයේ නිර්නායකයන්ට අනුකූල නොවන පරිදි අධිකාරිය විසින් සේවාදායක කොන්ත්‍රාත් කාර්යයන් සඳහා වැය කරන වියදමට සියයට 20 ක ලාභාන්තිකයක් එකතු කර සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 490.97 ක සේවාදායක ආදායම් හඳුනාගෙන තිබුණි. | ප්‍රමිත අංක 16 හි 38 වන වගන්තියෙන් හා 31,32,34 වගන්තිවලත් දක්වා ඇති පරිදි කොන්ත්‍රාත් පිරිවැය හා කොන්ත්‍රාත් අයභාරය හඳුනාගෙන ඇති අතර සෑම විටකම කොන්ත්‍රාත් වියදමට 20% ක ලාභාන්තිකයක් එකතු කර නොමැති බව දන්වමි. එසේම 39 වන ඡේදයෙන් නිමැවුම් අදියර මත කොන්ත්‍රාත් පිරිවැය තීරණය කරන්නේ නම් එම පිරිවැය තුළ අදාළ දිනට දරන ලද පිරිවැය ඇතුළත් වන බව සඳහන් වන බැවින් ඉහත සඳහන් වගන්ති අනුව අධිකාරිය විසින් කොන්ත්‍රාත් අයභාරය හඳුනාගෙන ගිණුම්ගත කර ඇත. | යොමුගත ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල සේවාදායක ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු අතර ඒ බව අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් සහතික විය යුතුය. |
| (ඝ) | අධිකාරයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2.1 ට අනුකූල වන පරිදි අන්තර්ජාතික රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 21 හි 26 හා 52 වගන්තීන් අනුව අස්ථිත්වයක් විසින් සෑම ගිණුම් වාර්තාකරණ දිනයකදි වත්කම් හානිකරණ පිළිබඳ ඇඟවීම් (Indication) පවතීද යන්න පිළිබඳ ඇගයීමක් කර, එසේ ඇඟවීම් පවතී නම්, වත්කමක ආපසු අයකර ගත හැකි අගය (Recoverable Amount) ගණනය කළ යුතු වුවත්, වර්ෂ 02 කට වැඩි කාලයක සිට පැවත එන පිළිවෙලින් වටිනාකම රු.මිලියන 32,676 ක් හා රු.මිලියන 577.28 ක් වු වැඩ පූර්ව අත්තිකාරම් සහ ණය ගැති ශේෂ සඳහා ප්‍රමිතය අනුව හානිකරන ගැලපීම් සිදුකර | මාර්ග සංවර්ධන අධිකාරිය සතු වත්කම් අයිතම ප්‍රමාණය අධික වන අතර එලෙස හානිකරණ ඇගයීම් සිදු කිරිම ප්‍රායෝගිකව දුෂ්කර කටයුත්තකි. එහෙත් ඒ සඳහා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කර දත්ත ඇතුළත් කිරීමෙන් පසු මෙම වත්කම් හානිකරණය පිළිබඳ ඇගයීම ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) ඇ වගන්තිය යටතේ වූ පද්ධති සමාලොචනයේදී මේ පිළිබඳ විශේෂ අවධානයක් සහිතව වගකීම් නිශ්චය කර අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා ලිඛිත උපදෙස් නිකුත් කළ යුතුය.<br>වැඩපූර්ව අත්තිකාරම් නිදහස් කිරීම, අයකිරීම ගිණුම් තැබීමේ දී සිදුකර ඇති විශමතා පිළිබඳ ආයතන සංග්‍රහයේ II කොටස XLVII පරිච්ඡේදයේ 8 වගන්තිය ප්‍රකාරව මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. තවද, මෙම ණය ගැති ශේෂය තුළ දැනට නොපවතින ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.මි 306.5 ක ශේෂයක්ද ඇතුළත් වී තිබුණු අතර එම වටිනාකම තහවුරු කිරීමට අදාළ ලිඛිත ගිවිසුම් හෝ ලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි. | | |
| (ඩ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 22 ඡේදයේ නිර්වචනයන්ට අනුකූලව, මාර්ග ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් අත්පත්කර ගනු ලබන සියළු ඉඩම් වල ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) වගන්තිය යටතේ වූ අත්පත්කර ගැනීමේ ගැසට් නිවේදනය නිකුත් කළ දින සිට වන්දි ගෙවීම සිදු කරන දිනය දක්වා ගෙවිය යුතු සියයට 07 ක වාර්ෂික පොලිය සඳහා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් ප්‍රතිපාදන සලසා නොතිබූ අතර ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක්ද, සිදුකර නොතිබුණි. තවද, අධිවේගී මාර්ග ව්‍යාපෘති 10 ක් වෙනුවෙන් පමණක් ඉඩම් කැබලි 43,350 ක් අත්පත්කරගෙන තිබූ නමුත් ඒවාට අදාළ වන්දි ගෙවීම සම්බන්ධ ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් අදාළ වන්දි හා පොළී මුදල් 38 (අ) ගැසට් නිවේදනය අනුව සකස් කර ඉල්ලුම් කරන අතර එම ඉල්ලීම් වලට 2024.12.31 දිනට අදාළ වන වන්දි හා පොළී මුදල් සඳහා වන විස්තර මූල්‍ය ප්‍රකාශන වල සාමාන්‍ය සටහන් අංක 01 (General Notes) යටතේ හෙළිදරව් කර ඇති අතර තවදුරටත් ගෙවිය යුතු පොළිය සඳහා ප්‍රතිපාදනයන් වෙන් කිරීමට කටයුතු කරනු ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) ආ වගන්තිය යටතේ වූ පද්ධති සමාලෝචනයේදී වන්දි ගෙවීම සම්බන්ධ ලේඛණ යාවත්කාලීනව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සඵලදායී අභ්‍යන්තර පාලනය සිදු වන බවට සහතික විය යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 13 හි 86(අ) ඡේදය අනුව ආයෝජන දේපළ අගය කිරීමට යොදා ගන්නා ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි. | ආයෝජන දේපළ අගය කිරීමට යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | යොමුගත ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශනයන්හි අදාළ හෙළිදරව් කිරීම් ප්‍රමාණාත්මකව සිදුකළ යුතු අතර ඒබව අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් තහවුරු කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දක්ෂිණ අධිවේගී මාර්ග දීර්ඝ කිරීම් (2 කොටස) ව්‍යාපෘතිය අවසන්කර 2021 දෙසැම්බර් 31 දින අධිකාරිය වෙත භාර දුන් ගොඩනැගිලි 12 ක වටිනාකම අධිකාරිය විසින් ගිණුම් තැබීමේ දී රු.මිලියන 141.43 ක් අඩුවෙන් සටහන් කිරීම හේතුවෙන් ගොඩනැගිලි වටිනාකම හා ප්‍රාග්ධන ප්‍රදාන ඊට සමාන වටිනාකමින් අවප්‍රමාණය වී තිබුණි. | මෙම ගොඩනැගිලි 2021 වර්ෂයේ අදාළ ව්‍යාපෘතිය විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදෙන ලද තොරතුරු අනුව ප්‍රාග්ධනිත කර ඇති අතර ඇවර ගිණුම් නිකුත් කිරීමෙන් පසුව සැසඳීමක් නොකළ බැවින් මෙසේ වෙනසක් හට හටගෙන ඇත. එය 2025 වසරේ ජර්නල් අංක 295/J03 මගින් නිවැරදි කර ඇත. | වත්කම් වල වටිනාකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කර ඇති බවට අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් තහවුරු කරගත යුතු අතර අවශ්‍ය නිවැරදි කිරීම් ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ සිදු කළ යුතුය. |
| (ආ) | 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ 20 වන වගන්තියට හා කම්කරු කොමසාරිස් ජනරාල් විසින් විගණක ඇමතූ අංක B/පොදු උපදෙස්/5 දරන 2022 ඔක්තෝබර් 19 දිනැති ලිපියේ සඳහන් කරුණු වලට පටහැනිව අධිකාරිය විසින් පාරිතෝෂික දීමනා ගණනය කිරීමේ දී මූලික වැටුප හා ජීවන වියදම් දීමනාවට අමතරව, ගැලපුම් දීමනාව, මාර්ග සංවර්ධන අධිකාරි දීමනාව, ආදී අනුමත නොවන දීමනා 12 ක් සැලකිල්ලට ගෙන පාරිතෝෂික ගණනය කිරීම සිදු කිරීම හේතුවෙන් පාරිතෝෂික වෙන් කිරීමේ වටිනාකම රු.මිලියන 954.34 කින් අධිගණනය කර සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඌන ගණනය කර තිබුණි. එසේම සිදුකරන ලද නියැදි පරීක්ෂාවට අනුව, 2024 ජනවාරි මස සිට මැයි මස දක්වා කාලය තුළ දකුණු පළාත් කාර්යාලයෙන් විශ්‍රාම ගිය නිලධාරීන් 07 දෙනෙකු වෙත එකතුව රු.මිලියන 1.06 ක්වූ පාරිතෝෂික දීමනා වැඩිපුර ගෙවා තිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පාරිතෝෂික ගෙවීම 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතෙහි 20 වන වගන්තියට අනුව සිදු කරයි. ඒකාබද්ධ වැටුප යන්නට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ගෙවනු ලබන අනෙකුත් ස්ථිර දීමනා සියල්ල අදාළ කර ගෙන ඇති අතර මෙය 1986 වර්ෂයේ සිට එකම පදනම මත සිදු කර ඇත. තවද දීර්ඝ කාලයක් තිස්සේ අධිකාරිය විසින් පාරිතෝෂික දීමනා ගණනය කිරීමේදී ඒකාබද්ධ වැටුප යන්නට අදාළ කර ගත් වැටුප වෙනස් කිරීම මගින් කාර්මික ආරවුලක් පැන නැගිය හැකි අතර ඒ සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස් කාර්යාලයෙන් විමසීම් කර අදාළ පියවර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | පාරිතෝෂික පනතේ විධිවිධාන ප්‍රකාරව පාරිතොෂික ගණනය කිරීම කළ යුතු අතර අධි ගෙවීම් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. ආයතන සංග්‍රහයේ II කොටස XLVII පරිච්ඡේදයේ 8 වගන්තිය ප්‍රකාරව මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | අංක 02/2016 දරන හා 2016 ඔක්තෝබර් 21 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව එක් එක් තනතුරු සඳහා වැටුප් වර්ධක ප්‍රතිශතය අවම 1% සිට උපරිම 2.9% දක්වා පරාසයක පැවතියදී, අධිකාරිය විසින් සියයට 04 ක වැටුප් වර්ධක සීමාවක් පදනම් කරගෙන පාරිතෝෂික වෙන් | සූත්‍ර ක්‍රමය අනුව පාරිතෝෂික ගණනය කිරීම ආරම්භයේ සිට වැටුප් වර්ධක ප්‍රතිශතය 4% ක් ලෙස ගණනය කර ඇත. එහෙත් ඉදිරි වර්ෂයේදී මෙම අනුපාතය සමාලෝචනය කර වඩාත් නිවැරදි ආසන්න ප්‍රතිශතයකට ගණනය කිරීමට කටයුතු කරනු ඇත. | පාරිතොෂික පනතේ විධිවිධාන ප්‍රකාරව පාරිතෝෂික වෙන්කිරීම් සිදු කළ යුතු අතර වටිනාකම් නිවැරදිව හඳුනානොගැනීමෙන් අතිරික්තයට සිදු වූ බලපෑම ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිරීම් රු.මිලියන 3,600.1 ක් ලෙස ගණනය කර තිබීම හේතුවෙන් සියයට 2.9 ක උපරිම වැටුප් වර්ධක සීමාව යටතේ වෙන් කළ හැකි උපරිම පාරිතෝෂික වෙන් කිරීම් වටිනාකම වූ රු.මිලියන 3,315.33 ට වඩා රු.මිලියන 284.77 ක් වැඩියෙන් පාරිතෝෂික වෙන්කර තිබුණි. ඒ අනුව එම අගයෙන් වියදම වැඩිවීමෙන් අතිරික්තය අවප්‍රමාණය වී තිබුණි. | | |
| (ඈ) | අධිකාරියේ සියළු පළාත් කාර්යාල සතුව 2024 දෙසැම්බර් 31 දිනට පවතින මුදල් ශේෂය ප්‍රධාන කාර්යාලය වෙත ප්‍රේෂණය කර එදිනට පවතින අතැති මුදල් ශේෂය ලෙස සටහන් කළ යුතු වුවත්, එසේ නොමැතිව සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත්කළ මූල්‍ය ප්‍රකාශනයනයෙහි මාර්ගස්ථ මුදල් ලෙස රු.මිලියන 422.95 ක් සටහන්කර තිබුණි. තවද, සිදුකළ නියැදි පරීක්ෂාවට අනුව, පළාත් කාර්යාල සහ පෙරමුසු අංගන වෙතින් ප්‍රධාන කාර්යාලය වෙත 2025 ජනවාරි 03 දින සිට පෙබරවාරි 10 දින දක්වා කාලය තුළ ප්‍රේෂණය කළ රු.මිලියන 311.27 ක මුදලක් 2024 දෙසැම්බර් 31 දිනට පැවති මාර්ගස්ථ මුදල් ලෙස සටහන් කිරීම හේතුවෙන් එම අගයෙන් මුදල් හා මුදල් සමාන දෑ වටිනාකම වැඩියෙන් හා පළාත් කාර්යාල සතුව අතැති මුදල් අඩුවෙන් සටහන් කර තිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරිය සතුව පවතින ආදායම් මගින් සිදු කරන ලද ගෙවීම් අදාළ පුද්ගලයන් එම මුදල් ලබා නොගැනීම නිසා නැවත ප්‍රධාන කාර්යාලය වෙත රු.මිලියන 0.67 ක් වටිනා චෙක්පත් 08 ක් මගින් ප්‍රේෂණය කර ඇති අතර ඒවා නැවත රේඛීය අමාත්‍යාංශය වෙත පියවීමක් සිදු නොකරයි.<br>පෙරමුසු අංගන වෙතින් ප්‍රධාන කාර්යාලය වෙත ප්‍රේශනය කර ඇති චෙක්පත් පෙරමුසු විකිණීමෙන් ලබා ගන්නා ආදායම් වන අතර ඒවා රේඛීය අමාත්‍යාංශය වෙත පියවීමක් සිදු නොකරයි. ඒවා නැවත පෙරමුසු අංගන වෙතම මෙහෙයුම් කටයුතු සඳහා ලබා දෙනු ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කර ඇති බව අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් සහතික විය යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) ඇ වගන්තිය යටතේ වූ පද්ධති සමාලෝචනයේදී ප්‍රධාන කාර්යාල හා පළාත් කාර්යාල අතර මුදල් ප්‍රේෂණ පිළිබඳ විශේෂ අවධානයක් සහිතව වගකීම් නිශ්චය කර අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා ලිඛිත උපදෙස් නිකුත් කර අධීක්ෂණය කළ යුතුය. |
| (ඉ) | මාර්ග සංවර්ධන අධිකාරියේ අනුබද්ධිත සමාගම් 03 වර්තමානය වන විට ඈවරකර තනි සමාගමක් පිහිටු වීමට අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණ ලබාගෙන තිබූ නමුත් අදාළ සමාගම් 03 විසින් අවසන් වරට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව අධිකාරිය විසින් අදාළ සමාගම් වෙත භාවිතය සඳහා ලබා දුන් පිරිවැය රු.මිලියන 17.55 ක් වූ වාහන 05 ක් සහ පිරිවැය සටහන් නොවූ වත්කම් අයිතම 39 ක් පවරාගෙන මූල්‍ය ප්‍රකාශන තුළ සටහන් කර නොතිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරියට අනුබද්ධිත සමාගම් 03 මඟින් ලබා ගත් වත්කම් පිළිබඳ විස්තරය ඇමුණුම 14 මඟින් ඉදිරිපත් කර ඇත. මෙම වත්කම් වලින් වාහන තක්සේරු කර අධිකාරියේ පොත් වලට ගෙන ඇති අතර අනෙකුත් වත්කම් තක්සේරු කිරීමට යම් පිළිගත් ක්‍රමවේදයක් සකසා ඒ අනුව තක්සේරු සිදු කිරීම කළ යුතු බැවින් ඒ පිළිබඳව ඉදිරියේදී කටයුතු කරනු ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාවට නැංවීම හා අධිකාරිය සතු වත්කම් නැවත පවරා ගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | මූල්‍ය ප්‍රකාශන අනුව පෙරමුසු අංගනයේ අමතර කොටස් තොගයේ වටිනාකම රු.මිලියන 157 ක් ලෙස ගිණුම් තබා ඇති නමුත් එයින් රු.මිලියන 47.86 ක් වූ අමතර කොටස් 2024 වර්ෂය තුළ භාවිතයට ගෙන තිබුණි. ඒ අනුව අවසන් තොගයෙහි වටිනාකම සහ සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම වටිනාකමින් අධිගණනය වී තිබුණි. | පෙරමුසු අංගනයේ කොටස් තොගයේ වටිනාකම රු.මිලියන 157 ක් ලෙස ගිණුම් තබා ඇති නමුත් එයින් රු.මිලියන 47.56 ක් වූ අමතර කොටස් 2024 වර්ෂය තුළ භාවිතයට ගෙන ඇති අතර මීට අදාළ ගිණුම් ගැලපුම් 2025 මාර්තු මස සිදු කර ඇත. | තොගය නිවැරදිව ගිනුම්ගත කිරීමට කටයුතු නොකිරීමෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තයට සිදු වූ බලපෑම ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ගලපා නිවැරදි කළ යුතුය. |
| (උ) | ඉබ්බාගමුව කුඹුක්ගැටේ මඩගල්ල මාර්ගය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියට අදාළව 2022 වර්ෂයේ ප්‍රාග්ධනිත කළ රු. මිලියන 52.04 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ දී නැවත ප්‍රාග්ධනිත කර තිබුණි. ඒ අනුව මාර්ග වත්කම රු.මිලියන 52.04 ක් වැඩියෙන්ද කෙරීගෙන යන වැඩ ගිණුම එම අගයෙන් අඩුවෙන්ද ගිණුම් ගතවී තිබුණි. | 2022 වර්ෂයේ ප්‍රාග්ධනිත කර 2024 වර්ෂයේදී වැරදීමකින් නැවත ප්‍රාග්ධනිත කර ඇති අතර මේ වන විටත් එය ජනල් අංක 156/J03 මගින් 2025 වසරේදී නිවැරදි කර ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) ඇ වගන්තිය යටතේ වූ පද්ධති සමාලෝචනයේදී සාවද්‍ය මූල්‍ය වාර්තාකරණය මඟින් වංචාකරුවන්ට පවතින ඉඩකඩ වැලැක්වීම සඳහා විශේෂ අවධානයක් සහිතව වගකීම් නිශ්චය කර අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා ලිඛිත උපදෙස් නිකුත් කර අධීක්ෂණය කළ යුතු අතර ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කළ යුතුය. |
| (ඌ) | ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය විසින් ප්‍රාග්ධන වැය විෂයක් යටතේ මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම් (RWI) සඳහා අධිකාරිය වෙත ලබාදුන් ප්‍රතිපාදන මගින් දරන ලද පිරිවැය ප්‍රග්ධනිත කළ යුතු වුවත්, එම වැය විෂය යටතේ සමාලෝචිත වර්ෂයේ දරන ලද රු. මිලියන 1,300.41 ක් ප්‍රග්ධනිත කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස සටහන් කිරීම හේතුවෙන් එම අගයෙන් මූල්‍ය ප්‍රකාශනයේ කෙරීගෙන යන වැඩ වටිනාකම හා අතිරික්තය අඩුවෙන් සටහන් වී තිබුණි. | සෘජු ශ්‍රමය යටතේ ඉදිකරන ලද මාර්ග වල ඉදිකිරීම් සඳහා 2024 වසරේදී රු. මිලියන 1,300.41 ක වියදමක් දරා ඇති අතර මෙම කාර්යයන් සඳහා අවශ්‍ය සෘජු ශ්‍රමය පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලවල සිටින සෘජු කම්කරුවන්ගෙන් ලබා ගන්නා අතර අමුද්‍රව්‍ය සඳහා මෙම වැය ශීර්ෂය යටතේ මුදල් ලබා ගනු ලබයි. මෙම සෘජු ශ්‍රමය යටතේ කරනු ලබන කාර්යයන් ප්‍රාග්ධනිත කිරීම ප්‍රායෝගිකව සංකීර්ණ කටයුත්තකි. මෙම මාර්ගයන් SLRAM පද්ධතිය මගින් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කර ඇති බව අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් සහතික විය යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) ඇ වගන්තිය යටතේ වූ පද්ධති සමාලෝචනයේදී කෙරීගෙන යන වැඩ නිවැරදිව ගිණුම්ගත කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා ලිඛිත උපදෙස් නිකුත් කර අධීක්ෂණය කිරීම හා ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ වැරදි නිවැරදි කිරීම නොපමාව සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඝ) | අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළ මගනැගුම ඉමල්ෂන් සමාගමේ සියයට 99 ක ඍජු පාලන හිමිකමක් අධිකාරියට හිමි බව හෙළිදරව් කර තිබුණ ද, ඒ සඳහා වන කොටස් සහතික විගණනයට ඉදිරිපත් නොවූ අතර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තුළ ද එම ප්‍රතිශතයට සමපාත නියෝජනයක් අධිකාරියට නොමැති අතර අදාළ සමාගමේ රු.මිලියන 01 ක ආයෝජනයක් සිදුකළ බව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන මගින් සඳහන් වුවද අදාළ සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව එය ණය මුදලක් ලෙස ගිණුම්ගත කිරීමේ දෝෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිවැරදි කර නොතිබුණි. | මේ වන විට මෙම සමාගම් ඈවරකරණයේ පවතින අතර ඈවරකරණ ගණුදෙණු වලදී මෙම ගැටළුව නිරාකරණය කර ගැනීමට කටයුතු කරනු ඇත. | සමාගම සම්බන්ධයෙන් අධිකාරියට ඇති අයිතිය තහවුරු කර ගත යුතුය. ආයතන සංග්‍රහයේ II කොටස XLVII පරිච්ඡේදයේ 8 වගන්තිය ප්‍රකාරව මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඞ) | කණු මතින් ඉදි වන අධිවේගී මාර්ග (නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා) ව්‍යාපෘතිය 16.4 km ක් දක්වා සංවර්ධනය කිරීමේ අරමුණින් 2017 අගෝස්තු මස ආරම්භ කර 2025 වර්ෂයේ දී අවසන් කිරීමට නියමිතව තිබූ නමුත්, ව්‍යාපෘතියේ ඉඩම් අත් කර ගැනීමේ ප්‍රගතිය සියයට 85 මට්ටමේ පැවතියදී 2023 ජනවාරි 31 දින ව්‍යාපෘතිය අතරමඟ නතරකර මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාර දී තිබුණි. ඒ වන විට පැවති ඉඩම් අත්පත්කර ගැනීමේ ප්‍රගතිය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එලෙසම පැවතීම හේතුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38(ආ) වගන්තිය අනුව ගැසට් පත්‍රයේ පල කරනු ලැබූ 2020 වර්ෂයේ සිට ව්‍යවස්ථාපිත වන්දි මුදල සඳහා සියයට 07 ක වාර්ෂික පොලී මුදලක් ගෙවීමට සිදු වුවත් ඊට අදාළ වෙන්කිරීම් සිදුකර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය අංක අමප/23/0631/608/47 හා 2023.05.03 දිනැති කැබිනට් තීරණය මගින් අත්හිටුවා ඇති අතර රාජගිරිය දක්වා කොටසට වන්දි හා පොළී ගෙවීම සඳහා වන අදාළ වෙන් කිරීම සිදු කිරීමට කටයුතු කරනු ඇත. | ව්‍යාපෘතිය අත්හිටුවීමේ තීරණ ක්‍රියාත්මක කිරීම, අත්පත් කර ගත් ඉඩම් උපයෝජනය, වන්දි ගෙවීම හා විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ විශ්ලේෂණයක් සිදුකර අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කර සිදුවන පාඩු හා හානි අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ච) | මධ්‍යම අධිවේගී මාර්ග අදියර IV ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 38(අ) වගන්තිය යටතේ හෙක්ටයාර් 475 ක් වූ බිම් ප්‍රමාණයක් අත්පත් කරගෙන තිබුණු අතර ඉඩම් අත්පත් පනතේ 10 (1) වගන්තිය නිකුත් කරන ලද කැබලි 2335 න් කැබලි 218 ක තක්සේරු වාර්තා ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒකතුව රු.මිලියන 455.51 ක් ලෙස වන්දි නිශ්චය කළ ඉඩම් කැබලි 207 ක් වූ අතර තක්සේරු වාර්තා | අදාළ වියදම කෙරීගෙන යන වැඩ යටතේ සඳහන් කර ඇති බැවින් එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.<br>තවද, ගෙවිය යුතු වන්දි හා පොලී මුදල් හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ. අමාත්‍ය මණ්ඩල අංක අමප/23/0345/60/030 හා 2023.03.20 දිනැති තීරණය අනුව මෙම ඉඩම් සම්බන්ධව රජයේ | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කර ඇති බව අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් සහතික විය යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) ඇ වගන්තිය යටතේ වූ පද්ධති සමාලෝචනයේදී ඉඩම් අත්පත්කර ගැනීම පිළිබඳ විශේෂ අවධානයක් සහිතව |

| | | | |
|---|---|---|---|
| | ලැබී තිබුණු ඉඩම් කැබලි 1571 න් කැබලි 863 කට අදාළව 17 වන වගන්තිය ප්‍රකාශයට පත්කර නොතිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ අත්පත් කරගනු ලැබූ ඉඩම් හෙක්ටයාර් 475 ට අදාළ වියදම් ඉඩම් වත්කම් යටතේ සටහන් කිරීමට සහ තක්සේරු වාර්තා ලැබී තිබුණු ඉඩම් සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු වන්දි හා පොලී මුදල් හඳුනාගෙන ගිණුම්ගතකිරීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය පමණක් ලියාපදිංචි කිරීම ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් මේ වන විට කටයුතු කර ඇති අතර මේ වන විට මෙම ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට තීරණය කර ඇති බැවින් ඒ අනුව ඉදිරියේදී කටයුතු කරනු ඇත. | වගකීම් නිශ්චය කර අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා ලිඛිත උපදෙස් නිකුත් කළ යුතුය. |
| (ඒ) | මාර්ග පුළුල් කිරීමේ සහ වැඩිදියුණු කිරීම යටතේ කෙරීගෙන යන වැඩ ගිණුමේ 2024 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 2,817.45 ක් ලෙස සඳහන්ව තිබෙන වටිනාකම තුළ රු.මිලියන 355.72 ක් වටිනා කොන්ත්‍රාත් 8 ක් 2017,2018,2019,2021 සහ 2022 වර්ෂයන්හි අන්තර් නිම කිරීමේ සහතික (Substantially Completed Certificate ) කොන්ත්‍රාත්කරු වෙත නිකුත් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අධිකාරිය විසින් අදාළ මාර්ග නිශ්චිතව අවසාන වී ඇත්ද ඇගයීමක් සිදු කර මාර්ග වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. ඒ අනුව කෙරීගෙන යන වැඩ වටිනාකම එම වටිනාකමින් අධිගණනය වී මාර්ග වත්කම් වටිනාකම ඌණ ගණනය වී තිබුණි. | කොන්ත්‍රාත් අඩුපාඩු සකස් කර නොමැති බැවින් වැඩ අවසන් කිරීමේ සහතික නිකුත් කර නොමැත. අදාළ වැඩ අවසන් කිරීමේ සහතික නිකුත් කළ පසු මාර්ග වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | මාර්ග වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඓ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විට පැවති කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීමට ඇති මුදලින් රඳවාගත් වටිනාකම වූ රු.මිලියන 4517.51 ක් ජංගම හා ජංගම නොවන වගකීම් ලෙස වෙන්කර මූල්‍ය තත්ත්ව විස්තරයේ සටහන්කර නොතිබුණි. තවද, එම ශේෂයෙහි ඇතුළත් රු.මි.2,500.74 ක් වූ රඳවාගැනීම් වටිනාකම මාර්ග කි.මී 100,000 ව්‍යාපෘතියට අදාළ වන අතර එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2022 වර්ෂයේදී අන්‍යෝන්‍ය එකඟතාවය මත අවසන්කර තිබුණද, කොන්ත්‍රාත් නිමවන කාලය, දෝෂ වගකීම් කාලය, කාලය දීර්ඝ කිරීම්, කාර්යසාධන බැඳුම්කර කාලය යනාදී තොරතුරු යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය 2022 වසරේ නිම කර ඇති අතර ඉතිරි වී ඇති සියළුම රඳවාගත් මුදල් ඉතා ඉක්මණින් නිරවුල් කළ යුතු බැවින් ජංගම වගකීම් යටතේ පෙන්නුම් කර ඇත. | අවසන් කරන ලද කොන්ත්‍රාත් වලට අදාළ තොරතුරු යාවත් කාලීනය පවත්වා ගැනීමට සහ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රඳවාගත් මුදල් නිවැරදිව ගිණුම් ගත කිරීමටත් කටයුතු කළ යුතුය. |

### 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.මි | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.මි | වෙනස රු.මි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| අධිවේගී මාර්ග භාවිතා කිරීමේ ආදායම | 12,153.45 | 12,092.59 | 60.86 | QR ලැබීම්, ETC ලැබීම් සහ සීදුවේ සිට පැමිණ ජාඇල හරහා පිටවන රථවාහන වලට අදාළ ටිකට් පත් නිකුත් වීම් POS යන්ත්‍ර මගින් සිදු නොවීම හේතුවෙන් 2024 වර්ෂයේදී දත්ත පද්ධතියට ඇතුළත් වී නොමැත. | මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමට පෙර ආදායම් නිවැරදිව ගිණුම්ගත කර ඇති බවට අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් තහවුරු කළ යුතු අතර වෙනසට හේතු හඳුනාගෙන නිවැරදි කිරීම් සිදු කළ යුතුය. |

### 1.5.5 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කි.මී 1500 ක විකල්ප මාර්ග පද්ධතියක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාළ ඉංජිනේරු ඇස්තමේන්තු අනුයාත කිරීමේ දී පරිපාලන වියදම් සඳහා සියයට 6.5 ක් ඇතුළත් කර තිබූ නමුත්, එම සීමාව ඉක්මවා අධිකාරියට අයත් මාර්ග ඉදිකිරීම වෙනුවෙන් වැය කර තිබුණු රු.මිලියන 101.49 න් රු.මිලියන 69.88 ක් හෙවත් සියයට 68 ක් අතිකාල, නිවාඩු දින, ගමන් වියදම්, තාක්ෂණික කමිටු ගෙවීම් ඉන්ධන හා අනෙකුත් වියදම් ඇතුළු පරිපාලන වියදම් සඳහා දරා තිබුණි. ඒ අනුව 2023 අංක 34 දරන විසර්ජන පනත අනුව පිළියෙල කළ වාර්ෂික අයවැය ප්‍රතිපාදන යටතේ ලද මුදල් වලින් රු.මිලියන 69.88 ක් විධිමත් අධිකාරී අනුමැතියකින් තොරව පුනරාවර්ථන වියදම් සඳහා වැය කර තිබුණු බැවින් හා මෙම වියදම් කෙරී ගෙන යන වැඩ ලෙස ප්‍රාග්ධනිත කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ කෙරී ගෙන යන | මාර්ග සංවර්ධන අධිකාරියේ චක්‍රලේඛ අංක 2024/CL/25 හා 2024.04.19 දිනැති හා ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MOT & M/ADM/04 (01)/RDA හා 2024.04.09 දිනැති ලිපි මගින් කි.මී.1500 ව්‍යාපෘතිය ඉතා කෙටි කාලයක් තුල කඩිනමින් අවසන් කළ යුතුව තිබූ නිසා පොදු කාර්ය පිරිවැය 6.5%ක වියදම් දැරීමට අනුමැතියට යටත්ව මෙම ව්‍යාපෘති කාර්යයන් සිදු කර ඇත. ඒ අනුව අධිකාරියට අයත් හා අධිකාරියට අයත් නොවන මාර්ග යන දෙකොටසම අයත් මාර්ග ඉදිකිරීම සිදු කර ඇති අතර ඒ සඳහා පොදු කාර්ය වියදම් දරා ඇත. තවද පරිපාලන වියදම් වෙනම මුදලක් ලෙස අමාත්‍යාංශය ලබා නොදුන් අතර ව්‍යාපෘතියට දුන් මුළු මුදල තුල කළමනාකරණය කර ගෙන ඇත. | විධිමත් අධිකාරී බලයකින් තොරව වියදම් කිරීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II කොටස XLVII පරිච්ඡේදයේ 8 වගන්තිය ප්‍රකාරව මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කළ යුතුය. |

වැඩ වටිනාකම වැඩියෙන්ද මෙහෙයුම් වියදම් අඩුවෙන්ද ගිණුම් ගත වී තිබුණි.

### 1.5.6 ඒකාබද්ධ කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අන්තර්ජාතික රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 35 හි 38 වගන්තිය අනුකූලව රාජ්‍ය අංශයේ ව්‍යවස්ථාපිත ආයතන ඒකාබද්ධ කර මූල්‍ය ප්‍රකාශන පිළියෙලකළ යුතු වුවත්, අධිකාරිය විසින් පරිපාලිත සමාගම් 04 ක් ඒකාබද්ධ කර සමූහයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | කැබිනට් මණ්ඩල පත්‍රිකාවක් මඟින් මෙම පරිපාලිත සමාගම් ඈවර කිරීමට තීරණය වී ඇති අතර ප්‍රමිත අංක 01හි 38, 39 වගන්ති අනුව මෙම සමාගම්වල අඛණ්ඩ පැවැත්මක් නොමැති බැවින් ද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර නොමැත. | සමූහයේ ගිණුම් ප්‍රතිපත්ති සමඟ අනුගත වන පරිදි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ වගකීම නිර්ණය කොට ඊට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.7 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල රු. මිලියන | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ලියා හරින ලද කෙරීගෙන යන වැඩ වටිනාකම | 8,550 | මාර්ග, පලාත් පාලන ආයතන වෙත භාර දුන් හා භාර ගත් ලේඛන | භාර දී ඇති සියළු මාර්ග වලට අදාළ ලිපි ලේඛන එම කාර්යාල මඟින් ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) ආ වගන්තියට අනුකූලව මාර්ග භාරදීම සහ භාර ගැනීමට අදාළ ලිපිගොනු සහ ලේඛණ විධිමත්ව පවත්වාගෙන යාම පිළිබඳ ලිඛිත උපදෙස් නිකුත් කර අධීක්ෂණය කළ යුතුය. |
| (ආ) | අමාත්‍යාංශ ප්‍රතිපාදන | 151,652 | එක් එක් වැය විෂයන්ට අදාළ ලෙජර් ගිණුම් | රේඛීය අමාත්‍යාංශයෙන් ලැබෙන අක්මුදල් ප්‍රතිප්‍රදාන සටහන් අංක 29 හා 30 මගින් දක්වා ඇති අතර වියදම් සටහන් අංක 41-46 යටතේ දක්වා ඇත. ඊට අමතරව ප්‍රාග්ධනීත කිරීම සඳහා ලැබෙන ප්‍රතිපාදන වලට අදාළ වියදම සටහන් අංක 13 යටතේ ද කෙරීගෙන යන වැඩ වලට අදාළ වියදම සටහන් අංක 15 මගින් දක්වා ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) ආ වගන්තියට අනුකූලව අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන මුදල් සහ ඊට අදාළව දරණ ලද වියදම් නිවැරදිව හඳුනාගත හැකි වන පරිදි ලෙජර් ගිණුම් වෙන් වෙන්ව පවත්වාගෙන යාම පිළිබඳ ලිඛිත උපදෙස් නිකුත් කර අධීක්ෂණය කළ යුතුය. |
| (ඇ) | ඉඩම් | 60,549.89 | ස්ථාවර වත්කම් ලේඛනයද, එම ඉඩම් වල | ඉඩම් වටිනාකමට අදාළ ස්ථාවර වත්කම් ලේඛනය ඇමුණුම 18 මගින් ඉදිරිපත් කර ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) ආ වගන්තියට අනුකූලව |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | අයිතියේ ස්වභාවය හඳුනා ගැනීමට අදාළ ලේඛන | | ස්ථාවර වත්කම් ලේඛණ සහ ඉඩම් වල අයිතිය හා ඊට අදාළ ලිපිගොනු සහ ලේඛණ පවත්වා ගෙන යාම පිළිබඳ ලිඛිත උපදෙස් නිකුත් කර අධීක්ෂණය කළ යුතුය. |
| (ඇ) | මාර්ග වත්කම් | 6,792.09 | නිශ්චිතව දරන ලද පිරිවැය, මාර්ග, දිනයන්, මාර්ග වල පැවැත්ම, වටිනාකම හා ක්ෂය ගණනය කිරීම් වල නිරවද්‍යතාවය තහවුරු කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛන හා තොරතුරු | මාර්ග වත්කම් ලේඛනයේ යාවත්කාලීන කිරීමේදී ඇති වූ දෝෂයක් නිසා මාර්ගයේ නම නිවැරදිව සඳහන් කිරීම මගහැරී ඇති අතර පොදු සටහන අංක 10 හි නිවැරදිව දරන ලද වටිනාකම සහ දුර ප්‍රමාණය සටහන් කර මූල්‍ය ප්‍රකාශන තුළින් ඉදිරිපත් කර ඇත. තවදුරටත් තොරතුරු **ඇමුණුම 19** මගින් දක්වා ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) ආ වගන්තියට අනුකූලව ස්ථාවර වත්කම් ලේඛණ සහ ඉඩම් වල අයිතිය හා ඊට අදාළ ලිපිගොනු සහ ලේඛණ පවත්වාගෙන යාම පිළිබඳ ලිඛිත උපදෙස් නිකුත් කර අධීක්ෂණය කළ යුතුය. |
| (ඉ) | සෘජු අමු ද්‍රව්‍ය තොගය | 1,222.23 | සත්‍යාපන ලේඛන | අදාළ තොරතුරු 2025.06.03 දින ඉදිරිපත් කර ඇත | එම |
| (ඊ) | ණයගැති ශේෂ (ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ඇතුළුව) | 833.17 | ශේෂ සනාථ කිරීමේ ලිපි | අදාළ ශේෂ සනාථ කිරීමේ ලිපි රජයේ විගණන අංශය වෙත ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත. | එම |
| (උ) | ණය හිමි ශේෂ | 17.47 | ශේෂ සනාථ කිරීමේ ලිපි | අදාළ ශේෂ සනාථ කිරීමේ ලිපි රජයේ විගණන අංශය වෙත ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත. | එම |
| (ඌ) | දේපල පිරියත හා උපකරණ | 525.014 | වත්කම් වලට අදාළ උප ලේඛන, ක්ෂය ගණනය කිරීමට අදාළ ලේඛණ | මහා මාර්ග දෙපාර්තමේන්තුවෙන් ලද මෙම වත්කම් වලින් මාර්ග සංවර්ධන අධිකාරියේ භාවිතයේ පවතින ගොඩනැගිලි, වාහන සහ පිරියත වල අගයන් තක්සේරු කර තක්සේරු වටිනාකම් මූල්‍ය වාර්තා වලට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) ආ වගන්තියට අනුකූලව ස්ථාවර වත්කම් ලේඛණ සහ ඉඩම් වල අයිතිය හා ඊට අදාළ ලිපිගොනු සහ ලේඛණ පවත්වාගෙන යාම පිළිබඳ ලිඛිත උපදෙස් නිකුත් කර අධීක්ෂණය කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 මුල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කළ අධිකාරියේ ඉදිකිරීම් අංශය යටතේ ක්‍රියාත්මක කළ මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම් කටයුතු සඳහා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු.මිලියන 71.45 ක් ලබා දී තිබුණු අතර එම ශේෂය තුළ ඇතුළත් 2021 වර්ෂයේ ලබා දී තිබුණු රු.මිලියන 13 ක් හා 2020 වර්ෂයේ දී තිබුණු රු.මිලියන 7 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | උතුරු පළාතට අයත් රු.මිලියන 13න් රු.මිලියන 8.3 ක් මේ වන විට අයකර ගෙන ඇති අතර ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා අදාළ බිල්පත් ලැබී ඇති බැවින් අදාළ මුදල අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. බස්නාහිර පලාතට අයත් රු.මිලියන 7 ක මුදල අය කර ගැනීමට විශේෂ ව්‍යාපෘති අංශය වෙත භාර දී ඇති අතර ඉදිරියේදී මෙම මුදල අය කර ගැනීමට කටයුතු කරනු ඇත. | ලැබිය යුතු මුදල් ශේෂ අදාළ ණයගැතියන් වෙතින් සනාථ කර ගත යුතුය. එසේ සනාථ නොවන ශේෂයන්ට අදාළ අනුමත පරිපාටීන්ගෙන් බැහැරව සැපයීමට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II කොටසේ XLVII පරිච්ඡේදයේ 8 වගන්තිය ප්‍රකාරව පරීක්ෂණයක් සිදු කර විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | පළාත් කොන්ත්‍රාත්කරුවන් 27 ක් වෙත කොන්ත්‍රාත් 47 ක් සඳහා වැඩ පූර්ව අත්තිකාරම් ලෙස රු.මිලියන 131 ක් ලබා දී තිබුණු අතර එම වටිනාකම තුළ බස්නාහිර සහ මධ්‍යම පළාතට අදාළව 2017 සිට 2020 කාලයේදී ලබා දී තිබුණු, රු.මිලියන 29.5 ක් සමාලෝචිත වර්ෂය වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව ඊට අදාළ හානිකරණ ගැළපීම් 2024 මුල්‍ය ප්‍රකාශ මගින් සිදු කිරීමට කටයුතු කර නොමැති අතර බැඳුම්කර කල් ඉකුත් වී තිබේ ද යන්න තහවුරු කර ගැනීමට අදාළ බැඳුම්කර පිටපත් විගණනයට ඉදිරිපත් නොවිය. | බස්නාහිර පළාතට අදාළව 2019 වර්ෂයේදී රාජ්‍ය නිර්මාණ නීතිගත සංස්ථාවට ලබා දුන් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වලින් 2024.12.31 දිනට නොපියවූ අත්තිකාරම් ශේෂය රු. 13,530,582.88 ක් වේ. අදාළ කොන්ත්‍රාත් සමාගම විසින් අත්තිකාරම් පියවා ගැනීමට ප්‍රමාණවත් පරිදි වැඩ නොකිරීම මත හා බිල්පත් ගෙවීම් නොකිරීම මත මෙම අත්තිකාරම් අය කර ගත නොහැකි වී ඇත. | අත්තිකාරම් නිරවුල් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොපමාව ගත යුතු අතර ආයතන සංග්‍රහයේ II කොටසේ XLVII පරිච්ඡේදයේ 8 වගන්තිය ප්‍රකාරව මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ද ගත යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට පැවති එකතුව රු.මිලියන 3,017.64 ක් වූ ණය හිමි ශේෂයෙන් රු.මිලියන 27.7 ක් වර්ෂ 02 ත් 05 ත් අතරද රු.මිලියන 13.8 ක් වර්ෂ 05 ත් 10 ත් අතරද රු. මිලියන 6.08 ක් වර්ෂ 10 ක්ද කල් ගත වී තිබුණද එම ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් | වසර 10ක් කල් ගත වූ රු. මිලියන 6.08 ක අගය දක්වා ඇත්තේ මාර්ග නඩත්තු කොන්ත්‍රාත්කරුවන් විසින් තබන ලද ආරක්ෂිත තැන්පතු මුදල් වන අතර 2025 වසර තුල ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ. | අදාළ සේවාවන් සැපයීම හා ඊට අදාළ පරිපාටීන් අනුගමනය කිරීමකින් පසු ණය හිමියන් හඳුනාගන්නා බවත් ගෙවිය යුතු ශේෂ නිසි වර්ගීකරණයක් සහිතව වාර්තාකර ඇති බවත් අදාළ පරිදි කපාහැරීම් සහ |

| | | |
|---|---|---|
| වන විටත් කටයුතු කර නොතිබුණි. | තවද වසර 2-5ත් අතර ඇති රු. මිලියන 27.7 ක මුදල හා වසර 5-10 අතර ඇති රු.මිලියන 13.8 සම්බන්ධයෙන් අවශ්‍ය නිරවුල් කිරීමේ කටයුතු ඉදිරියේදී සිදු කරනු ඇත. | වෙන්කිරීම් සිදුකර ඇති බවටත් සහතික වීමෙන් පසුව අදාළ වගකීම් පියවීමට කටයුතු කළ යුතු අතර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ) ඡේදය යටතේ වූ සමාලෝචනයේදී මෙම ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂ අවධානය යොමුකර අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පරිපාටීන් හඳුන්වා දී ලිඛිත උපදෙස් නිකුත් කර අධීක්ෂණය කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනත | | | |
| i. | 6(1) වගන්තිය | උසස් මාර්ග පද්ධති ප්‍රතිපත්තියක් සකස් කිරීමට, ක්‍රමෝපාය සංවර්ධනය කිරීමට, මාර්ග පිළිබඳ පර්යේෂණ හා මාර්ග ආරක්ෂණය සම්බන්ධයෙන් පියවර ගැනීමට, අධිකාරිය විසින් යොමු කරනු ලබන මාර්ග සැලසුම් පිළිබඳ කටයුතු කිරීමට අමාත්‍යවරයා වෙත උපදෙස් ලබා දීම සඳහා පිහිටවිය යුතු "මාර්ග පද්ධති සංවර්ධන උපදේශක සභාව" පිහිටුවා නොතිබුණි. | නව විෂය භාර අමාත්‍යවරයා යටතේ මාර්ග පද්ධති සංවර්ධන උපදේශක සභාව පිහිටුවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | පනතේ විධිවිධාන අනුව "මාර්ග පද්ධති සංවර්ධන උපදේශක සභාව" පිහිටුවීමට කටයුතු කළ යුතුය. |
| ii. | 7(3) වගන්තිය | දිස්ත්‍රික් මාර්ග පද්ධති සංවර්ධන සම්බන්ධීකරණ කමිටු මගින් සෑම දිස්ත්‍රික්කයක් සඳහාම මාර්ග සංවර්ධන අධිකාරිය, අදාළ පළාත් සභාව, අදාළ පළාත් පාලන ආයතන සහ වෙනත් නියෝජිත ආයතන විසින් භාර ගෙන ඇති දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති නිශ්චිතව දක්වන | දිස්ත්‍රික් මාර්ග සංවර්ධන සම්බන්ධීකරණ කමිටු සඳහා පළාත්සභා හා පළාත් පාලන ආයතනයන්ගේ මහජන නියෝජිත සහභාගීත්වය අවශ්‍ය බැවින් අදාළ පළාත්සභා හා පළාත් පාලන ආයතන සඳහා මහජන නියෝජිතයින් පත් කර | පනතේ විධිවිධාන අනුව "ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්මක්" සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | “ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්මක්” සකස් කළයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ගැනීමෙන් අනතුරුව මාර්ග පද්ධති සංවර්ධන උපදේශන සභාවේ කාර්යයන් ඉටු කිරීමට අපේක්ෂා කර ඇත. | |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| i. | මුදල් රෙගුලාසි 3(2) ii (ආ) | මූලික පිරිවැය රු. මිලියන 10 ට නොඅඩු සහ වාර්ෂික පුනරාවර්තන හා නඩත්තු පිරිවැය රු. ලක්ෂ 05 ඉක්ම වන්නාවූ ව්‍යාපෘතීන් අදියර දෙකකදී අනුමත කිරීමේ කාර්ය පරිපාටිය සම්පූර්ණයෙන්ම අනුගමනය කළ යුතු වුවත්, මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කළ මාර්ග සංවර්ධන කොන්ත්‍රාත් පැකේජ 3928 ක් සඳහා මූලික අනුමැතිය පමණක් ලබාගෙන තිබුණු අතර, ඒ යටතේ මාර්ග කි.මී 17,847 ක් සංවර්ධනය සඳහා දරන ලද රු.මිලියන 188,955.91 ක පිරිවැය සඳහා විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතිය සඳහා අංක 19/3398/221/001 හා 2019.12.18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී මූලික අනුමැතිය ලබා ගෙන ඇති අතර මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය සහ ප්‍රතිපාදන වෙන් කර ගැනීමේ ක්‍රමවේදය සඳහා අමාත්‍ය මණ්ඩල තීරණ අංක 20/0142/221/005 හා 2020.02.05 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීම මගින් දෙවන අනුමැතිය ලබා ගෙන ඇත. | මුදල් රෙගුලාසි වලට අනුකූල නොවීම සම්බන්දයෙන් ආයතන සංග්‍රහයේ II කොටස XLVII පරිච්ඡේදයේ 8 වගන්තිය ප්‍රකාරව මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| ii. | මුදල් රෙගුලාසි 102-113 | වර්ෂ 2008 හා 2009දී ජනාධිපති ලේකම් කාර්යාල වෙත නිදහස් කරන ලද රු.මිලියන 3.24 ක වටිනාකමින් යුත් වාහන 04ක් සහ පිරිවැය සටහන් නොකළ වාහන 01 ක් එම කාර්යාලයේ නොමැති බව අධිකාරිය වෙත ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රවාහන අධ්‍යක්ෂ විසින් 2015මාර්තු 17දින දැනුම් දී ඇති බව මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2024 ඔක්තෝබර් 01 දින පොලීස්පතිවරයා වෙත දැනුම් දී තිබුණි .ඒ අනුව අදාළ වාහන භාරදුන් සහ භාර ගත් පුද්ගලයින් පිළිබඳ විධිමත් විමර්ශණයක් පවත්වා මුදල් රෙගුලාසි අනුව | එක් වාහනයක් මේ වන විට සූරිය වැව පොලිස් ස්ථානයේ ගාල් කර ඇති අතර එය නැවත ලබා ගැනීමට නීති අංශය මගින් කටයුතු කරමින් පවතී.<br>තවත් එක් වාහනයක් ගොතටුව පොලීසිය මගින් සොයා ගෙන ඒ පිළිබඳව අදාළ නීතිමය කටයුතු සිදු කරමින් පවතින අතර අදාළ වාහනය අඟුලාන වැඩ බිම් පරිශ්‍රයේ ගාල් කර ඇත.<br>ඉතිරි වාහන 03 පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් විමර්ෂණ සිදු කරමින් පවතී. | මුදල් රෙගුලාසි වලට අනුකූල නොවීම සම්බන්දයෙන් ආයතන සංග්‍රහයේ II කොටස XLVII පරිච්ඡේදයේ 8 වගන්තිය ප්‍රකාරව මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | වගකිව යුත්තන් හඳුනා ගැනීමට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. | | |
| iii. | මුදල් රෙගුලාසි 371 (5) | තත්කාර්ය අතුරු අග්‍රිම ශේෂයන් ආපසු භාර දීම කවර අන්දමකින් වුවද එම අග්‍රිමය නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩියෙන් ප්‍රමාද නොකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට අධිකාරිය විසින් ලබා දී තිබුණු රු.මිලියන 119.95 ක අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. එම වටිනාකම තුළ වූ එකතුව රු.මිලියන 53.9 ක් වර්ෂ 01 සිට වර්ෂ 35 ක අතර කාලයක සිට පියවා නොතිබුණි. | අය කර ගැනීමට නොහැකිව පවතින අත්තිකාරම් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනු ඇත. | අත්තිකාරම් ලබා දීම පියවීම සම්බන්ධ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතු අතර ආයතන සංග්‍රහයේ II කොටස XLVII පරිච්ඡේදයේ 8 වගන්තිය ප්‍රකාරව මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| iv. | මු.රෙ 880 | මුදල් රෙගුලාසි ප්‍රකාරව මුදල් ආදායම් භාර ගැනීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව වුතු හෝ බලය පැවරෙන නිලධාරීන් ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කෙරෙන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් අධිවේගී මාර්ග සේවය සඳහා සමාලොචිත වර්ෂය අවසන් වන විට යොදවාගෙන තිබුණු මුදල් අයකැමිවරුන් 943 ක් ගෙන් ඇප සුරුකුම් ලබා ගෙන නොතිබුණි. | මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු අදාළ මුදල් අයකැමිවරුන්ගෙන් ඇප සුරැකුම් ලබා ගැනීමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි වලට අනුකූල නොවීම සම්බන්දයෙන් ආයතන සංග්‍රහයේ II කොටස XLVII පරිච්ඡේදයේ 8 වගන්තිය ප්‍රකාරව මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 7.2 ඡේදය | බදු කාලය ඉක්මවා නිවාසයක පදිංචිව සිටින කාල පරිච්ඡේදය වෙනුවෙන් නිලධරයාගේ වැටුපෙන් සියයට 08 ක ප්‍රමාණයක දණ්ඩන කුලියක් අයකර ගත යුතු වුවත් දකුණු පළාත් කාර්යාලයේ සේවය කරන නිලධාරීන් 03 දෙනෙකුගෙන් එකතුව රු. 618,213 ක්වූ දණ්ඩන කුලී අයකර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනු ඇත. | ආයතන සංග්‍රහයේ II කොටස XLVII පරිච්ඡේදයේ 8 වගන්තිය ප්‍රකාරව මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර දණ්ඩන කුලී අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.6 ඡේදය | 2020 ජනවාරි 01 දිනෙන් පසු වෙළඳපළ මිල සැඳහුම් ක්‍රමය යටතේ සිදු කරන ප්‍රසම්පාදන කාර්යයන් e-GP Portal හරහා සිදු කළ යුතු බව දක්වා තිබුණ ද, අධිකාරිය විසින් එම විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමය (e-procurement) මේ දක්වා අනුගමනය කර නොතිබුණි. | වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය යටතේ සිදු කරනු ලබන ප්‍රසම්පාදන කාර්යයන් e-GP Portal හරහා සිදු කිරීම ආරම්භ කළ අතර එහිදී සැපයුම්කරුවන් වෙන් වෙන්ව ගොනු කර නොතිබූ බැවින් සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී ගැටළු සහගත තත්ත්වයන් මතු විය. e-GP කාර්යාංශය මගින් එය නිවැරදි කළ පසු ඉදිරියේදී වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය යටතේ e-GP හරහා සිදු කිරීමට පියවර ගනු ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) ඇ වගන්තිය යටතේ වූ පද්ධති සමාලෝචනයේදී ප්‍රසම්පාදනය සම්බන්ධව විශේෂ අවධානයක් සහිතව වගකීම් නිශ්චය කර අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා ලිඛිත උපදෙස් නිකුත් කර අධීක්ෂණය කළ යුතුය. |
| (ඉ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 හා 2022 මැයි 30 දිනැති අංක 04/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛ | මෙම චක්‍රලේඛ මගින් වියදම් සීමා කිරීම් සම්බන්ධයෙන් උපදෙස් ලබා දී තිබිය දී, එම කරුණු නොසලකා රේඛීය අමාත්‍යාංශයේ හා රාජ්‍ය අමාත්‍යාංශයේ අවශ්‍යතාවයන් සඳහා 2023 ජනවාරි මාසයේ සිට 2024 මාර්තු මාසය දක්වා කාලය තුළ අධිකාරියට අයත් වාහන භාවිතා කිරීම වෙනුවෙන් රු.මිලියන 4.39 ක් ද, ඉන්ධන ලීටර් 12,605.91 ක් විධිමත් අනුමැතියකින් තොරව ලබා දී තිබුණි. | රේඛීය අමාත්‍යාංශය හා රාජ්‍ය අමාත්‍යාංශය මගින් කරන ලද ඉල්ලීම් මත වාහන ලබා දී ඇති අතර ඊට අවශ්‍ය ඉන්ධන ද අධිකාරිය මගින් ලබා දී ඇත. මේ වන විට ඉන්ධන ලබා දීම සීමා කර ඇත. | ආයතන සංග්‍රහයේ II කොටස XLVII පරිච්ඡේදයේ 8 වගන්තිය ප්‍රකාරව මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර අධිකාරියේ සම්පත් අවභාවිතය සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග නොපමාව ගත යුතුය. |
| (ඊ) | 1995 ජුලි 21 දින ජනාධිපති ලේකම් කාර්යාලය නිකුත් කළ රජයේ ඉඩම් පැවරීම පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 07 සහ 08 ඡේද | රජයේ ඉඩම් පැවරීම පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය අනුව, වෙළඳපළ පදනම් කරගත් බදු ගිවිසුම් සඳහා යථාර්තවාදී බදු කුලියක් නියම කළ යුතු අතර, ගිවිසුමේ කොන්දේසි ලෙස අවුරුදු 05 කට වරක් බදුකුලී ප්‍රතිශෝධනය කළ යුතු වුවත් එසේ නොමැතිව, කළුතර දිස්ත්‍රික්කයේ මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කොලැහැකඩ ගමෙහි මූලික පිඹුරුපත් අංක 4363 දරන හෙක්ටයාර් 6.40 ක ප්‍රමාණය කැබලි අංක 01 සිට 09 දක්වා කොටස් 09 කට බෙදා වෙන් කර, වැලිපැන්න සේවා පෙදෙස ඉදිකිරීම සඳහා එම කැබලි වලින් අංක 04 | මෙම ඉඩම් පැවරීමට අදාළව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2012.09.14 දිනැති තක්සේරුව මගින් ඉහත සඳහන් වැලිපැන්න කොළහැකඩ ප්‍රදේශයේ පිඹුරු අංක 4363 දරන ඉඩමේ කැබලි අංක 4,6,1 සහ 9 ට අදාළව තක්සේරු වාර්තාවක් ලබා දී ඇත. එහිදී කැබලි අංක 4ට සහ 6 ට අවුරුදු 99 කට සහ කැබලි අංක 1 සහ 9 සඳහා අවුරුදු 30 කටද අදාළව බදු මුදල් දක්වා ඇත. එම තක්සේරු වාර්තාව තුල වසර පහකට | ඉඩම් පැවරීම පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් කඩකළ නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සහ 06 දරන ඉඩම් වසර 99 ක කාලයක් අක් මුදල් ලෙස (එකවර ගෙවන) රු.මිලියන 21.8 ක් සහ රු.10,000 ක වාර්ෂික නාමික බදුකුලී ගෙවීමේ පදනම මත පුද්ගලික සමාගමක් වෙත 2011 වර්ෂයේදී බදු පදනම ලබා දී තිබුණි. තවද, එම කැබලි වලින් අංක 01 සහ 09 දරන ඉඩම් වසර 30 ක් සඳහා ඉන්ධන පිරවුම්හල් පවත්වා ගෙන යාමට අක් මුදල් ලෙස (එකවර ගෙවන) රු. මිලියන 2.92 ක් සහ රු.10,000 ක වාර්ෂික බදු කුලි ගෙවීමේ පදනම මත වෙනත් පුද්ගලික සමාගමක් වෙත 2013 සහ 2014 වර්ෂයන්හි දී බදු දී තිබුණි. | වරක් බදු කුළී ප්‍රතිශෝධනය කළ යුතු බව දක්වා නොමැත. | |
| (උ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | | |
| i. | 1 ඡේදය | අධිකාරිය විසින් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණු අතර කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීමට හෝ කාර්ය සාධනය ඇගයීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කර නොතිබුණි. | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ක්‍රමවේදය මේ වන විටත් ක්‍රියාත්මක කරන අතර මානව සම්පත් කළමනාකරණ අත්පොත සකස් කළ පසු කාර්ය සාධන ඇගයීමේ ක්‍රමවේදය ආරම්භ කරනු අත. | අධිකාරියේ නිලධාරීන්ගේ කාර්ය සාධනය ඇගයීමේ ක්‍රමවේදයක් සකස් කර මානව සම්පත් සංවර්ධනය කිරීමේ කටයුතු විධිමත් කළ යුතුය. |
| ii. | 5 ඡේදය | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2024 වර්ෂයට අදාළව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අනුමත කරන ලද මානව සම්පත් සංවර්ධන සැලැස්ම (අභ්‍යන්තර පුහුණුවීම්) හි පිටපතක් ඇමුණුම 25 මඟින් දක්වා ඇත. | චක්‍රලේඛ විධිවිධානයන්ට අනුකූලව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කළ යුතුය. |
| (ඌ) | 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2009/09 | පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ කර ගැනීමෙන් පසුව ගෙවීම් සහතික කළ යුතු වුවත්, එසේ නොමැතිව පැමිණීමේ ලේඛනය අනුව සේවයට වාර්තා කළ සහ පිටව ගිය වේලාවන් පරීක්ෂා කිරීම මත | ඇතැම් නිලධාරීන්ගේ අතිකාල ගෙවීම් අඟිලි සලකුණු යන්ත්‍ර මඟින් ලබාගත් වාර්තා මතද, ඇතැම් නිලධාරීන්ගේ අතිකාල ගෙවීම් පැමිණීමේ ලේඛන මතද ගෙවීම් සිදුකර | ආයතන සංග්‍රයේ II කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව මේ පිළිබද පරීක්ෂණයක් සිදු කර චක්‍රලේඛවලට අනුගත නොවූ නිලධාරීන් සම්බන්ධයෙන් |

| | | | | |
|---|---|---|---|---|
| | | පදනම්ව සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 94.46 ක් අතිකාල ලෙස ගෙවා තිබුණි. තවද, මාතර විධායක ඉංජිනේරු කාර්යාලයේ සේවය කරන කාර්මික නිලධාරියකු 2024 මාර්තු 25 දින සිට 2025 පෙබරවාරි 11 දින දක්වා කාලය තුළ පැමිණීම සහ පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කර නොතිබුණු නමුත් එම කාලය තුළ වැටුප් හා දීමනා වශයෙන් රු.මිලියන 1.09 ක් අධිකාරිය විසින් ගෙවා තිබුණි. | ඇත. මේ වන විට ඇඟිලි සලකුණු යන්ත්‍රයේ දත්ත හරහා පැමිණීම හා පිටවීම සනාථ කිරීම සිදු කරනු ඇත. | විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (සa) | 2006 සැප්තැම්බර් 22 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 හි ඇමුණුම II හි 04 ඡේදය | දෙපාර්තමේන්තුවේ නියමයන්ට හා මාර්ගෝපදේශයන්ට අනුව සකස් කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් සකසා ගැනීමට යටත්ව එම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත්කර තිබූ කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගතකරණ නිර්දේශයන් ක්‍රියාත්මක නොකර අධිකාරිය විසින් බඳවා ගෙන තිබුණු තනතුරු නිලධාරීන් 106 දෙනෙකු වෙනුවෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණු MM 1-3 වැටුප් පරිමාණයේ නියමිත වැටුප් පරිමාව වෙනුවට HM වැටුප් පරිමාවේ පිහිටුවා තිබුණි. එම නිලධාරීන් වෙත ගෙවිය යුතු වැටුප් පරිමාණයේ මූලික වැටුපට වඩා රු.මිලියන 451.58 ක් මූලික වැටුප් ලෙස ගෙවා තිබුණි. | මේ වන විට ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් හා නිලධාරීන් හට HM 1 වැටුප් කේතය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත පමණක් ලබා දීමට කටයුතු කරයි. | ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර චක්‍රලේඛවලට අනුගත නොවූ නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (සaa) | 2009 මැයි 26 දිනැති කළමනාකරණසේවා චක්‍රලේඛ අංක 39 | නිලධාරීන් හට අනුමත වූ වැටුපකට අමතරව යම් දීමනාවක් ලබා ගන්නේ නම් ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් හා වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාවෙන් අනුමැතිය ලබා ගත යුතු වුව ද, ඊට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් පදනම්ව මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සඳහා වෘත්තීය දීමනාව (Professional | මාර්ග සංවර්ධන අධිකාරිය හා සමාන සේවා සපයන ආයතනයන් වන ලංකා විදුලිබල මණ්ඩලය, ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය වැනි ආයතනයන්හි වෘත්තිකයන් සඳහා වෘත්තීය දීමනාව ගෙවනු ලබන බැවින්, එයට අනුව අධිකාරියේ වෘත්තිකයන් හට සිදුවී තිබූ වැටුප් විෂමතාවයට | ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර චක්‍රලේඛවලට අනුගත නොවූ නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | Allowance) ලෙස රු.මිලියන 98.71 ක් හා 2015 අප්‍රේල් 04 දින අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සියළු වෘත්තීය සමිති ඇමතූ ලිපියක් පදනම් කරගෙන අධිකාරී දීමනා ලෙස රු.මිලියන 976.61 ක් ද සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | පිළියමක් ලෙසත්, වරලත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (Corporate Membership) ලබා ඇති විධායක ශ්‍රේණියේ තනතුරු දරන නිලධාරීන් හට වෘත්තීය දීමනාවක් ගෙවීමට අංක. 1698/2016 මගින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. | |
| (එ) | 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| i. | 4.2.1 (අ), (ආ), (ඉ) ඡේදය සහ 4.2.2 (අ) ඡේදය | අවම වශයෙන් වර්ෂ 03 ක කාලයක් සඳහා සකස් කර මාස 06 කට වැඩි නොවන කාලයක් තුළ නිතිපතා යාවත්කාලීන කළ යුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර ක්‍රමානුකූලව විස්තර කෙරෙන ප්‍රසම්පාදන කාල සටහනක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සකස් කර නොතිබුණි. | වර්ෂ තුනක කාලයක් සඳහා සකස් කරන ලද ප්‍රසම්පාදන සැලසුම සහ වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ද ලබා ගෙන මේ වන විට වෙබ් පිටුවෙහි පල කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා පියවර ක්‍රමානුකූලව විස්තර කෙරෙන ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙළ කළ යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) ඇ වගන්තිය යටතේ වූ පද්ධති සමාලෝචනයේදී මේ පිළිබඳ විශේෂ අවධානයක් සහිතව වගකීම් නිශ්චය කර අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා ලිඛිත උපදෙස් නිකුත් කර අධීක්ෂණය කළ යුතුය. |
| ii. | 8.10.1 ඡේදය සහ 8.11.4 (අ)(i) ඡේද | අධිකාරිය විසින් ප්‍රදානය කර තිබූ කොන්ත්‍රාත් පිළිබඳ තොරතුරු අධිකාරියේ වෙබ් අඩවියේ හෝ වෙනත් උචිත මාධ්‍යයක හෝ ප්‍රසිද්ධියට පත් කර නොතිබූ අතර, කොන්ත්‍රාත් පැහැර හැරි සැපයුම්කරුවන් පිළිබඳ දත්ත මූලාශ්‍රයක් නඩත්තු කර නොතිබුණි. | අධිකාරිය විසින් ප්‍රදානය කරනු ලබන කොන්ත්‍රාත් පිළිබඳව සහ කොන්ත්‍රාත් පැහැර හැර ඇති සැපයුම්කරුවන් පිළිබඳ අධිකාරියේ වෙබ් පිටුවෙහි ඉදිරියේදී පල කිරීමට කටයුතු කරනු ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ) ඡේදය යටතේ වූ සමාලෝචනයේදී මෙම ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂ අවධානය යොමුකර අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පරිපාටීන් හඳුන්වාදී ලිඛිත උපදෙස් නිකුත් කර අධීක්ෂණය කළ යුතුය. |
| (ඒ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ මගින් | | | |

| | | | | |
|---|---|---|---|---|
| | හඳුන්වාදුන් රජය සතු ව්‍යවසායන් සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| i. | 2.3 ඡෙදය | ජාතික ප්‍රතිපත්තිමය රාමුවක් තුළ තම ආයතනයේ ස්ථාපිත අරමුණු ලඟාකර ගැනීම සඳහා උපායමාර්ගික සැලැස්ම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික අයවැය සකස්කර මූල්‍ය වර්ෂය ආරම්භවීමට දින 15 කට පෙර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කලයුතු වුවද, අධිකාරිය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2024-2028 වර්ෂය සඳහා සැකසූ ආයතනික උපායමාර්ග සැලසුම්, 2024.05.21 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමත කළ අතර, 2024.06.17 වන දින අමාත්‍යාංශය වෙත යොමු කොට ඇත. | උපායමාර්ගික සැලැස්ම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික අයවැය සකස්කර මූල්‍ය වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම පිළිබඳ විශේෂ අවධානයක් සහිතව වගකීම් නිශ්චය කර අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා ලිඛිත උපදෙස් නිකුත් කර අධීක්ෂණය කළ යුතුය. |
| ii. | 2.3 ඡේදය | රජය සතු සියළු ව්‍යවසායන් වෙනුවෙන් ඔවුන් සතුව පැහැදිළිව නිර්වචනය කරනු ලද පද්ධතීන්, ක්‍රියාවලීන් හා පිළිවෙළ ඇතුළත් මාර්ගෝපදේශයන් මෙම මාර්ගෝපදේශයට අනුකූලව පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර පවත්වාගෙන යා යුතු වුවත්, අධිකාරියේ මූල්‍ය කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, වාහන කළමනාකරණය, ඉඩම් කළමනාකරණය, සේවාදායක වැඩ කළමනාකරණය, ව්‍යාපෘති අතර වත්කම් කළමනාකරණය, ආයෝජන කටයුතු යනාදී ප්‍රධාන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් එවැනි මාර්ගෝපදේශ පිළියෙල කර පවත්වාගෙන ගොස් නොතිබුණි. | ප්‍රධාන ක්ෂේත්‍රයන් වෙනුවෙන් මාර්ගෝපදේශ සැකසීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | චක්‍රලේඛ විධිවිධාන අනුව ප්‍රධාන ක්ෂේත්‍රයන් වෙනුවෙන් මාර්ගෝපදේශ සකස් කිරීමට කටයුතු කළ යුතු අතර පද්ධති සමාලෝචනයේදී මේ පිළිබඳ විශේෂ අවධානයක් සහිතව වගකීම් නිශ්චය කර අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා ලිඛිත උපදෙස් නිකුත් කර අධීක්ෂණය කළ යුතුය. |
| iii. | 3.2 ඡේදය | බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය සඳහා (Scheme of Recruitment) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහ රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශ සහිතව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුව ද, අධිකාරියේ | බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මේ වන විට ලබා ගෙන ඇති අතර තව දුරටත් ලබා ගත යුතුව ඇත්තේ ඉංජිනේරු (Incorporate), | මාර්ගෝපදේශ සංග්‍රහය අනුව සියළු සේවකයින් සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් අනුමතකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ඉංජිනේරු, ජ්‍යෙෂ්ඨ කාර්මික නිළධාරී, ජ්‍යෙෂ්ඨ විදුලි අධිකාරී සහ ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික නිළධාරී සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් අනුමත කරගෙන නොතිබුණි. | ජ්‍යෙෂ්ඨ කාර්මික නිළධාරී, ජ්‍යෙෂ්ඨ විදුලි අධිකාරී, ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික නිළධාරී යන තනතුරු සඳහා පමණි. | |
| iv. | 3.3 ඡේදය | අධිකාරිය විසින් පිළියෙල කරනු ලබන උපාය මාර්ගික සැලැස්මෙහි ආයතනයේ එක් එක් අංශයේ (Divisions of the SOE) සේවක අවශ්‍යතාවය, මානව සම්පත් සැලැස්මක් ආකාරයෙන් (Human Resource Plan) දැක්විය යුතු වුව ද එවැනි අංශ වශයෙන් සේවක අවශ්‍යතාවයක් පිළියෙල කර නොතිබුණි. | මානව සම්පත් කළමනාකරණ හා පාලන අංශය මගින් අධිකාරියේ එක් එක් අංශයේ සේවක අවශ්‍යතාවය ,සඳහා මානව සම්පත් සැලැස්ම මේ වන විට පිළියල කරමින් පවතී. | මාර්ගෝපදේශ සංග්‍රහය අනුව එක් එක් අංශයේ සේවක අවශ්‍යතාවය, මානව සම්පත් සැලැස්මක් ආකාරයෙන් විධිමත්ව සකස් කළ යුතුය. |
| v. | 3.5 ඡේදය | කැබිනට් මණ්ඩල අනුමැතියකින් තොරව රාජ්‍ය ව්‍යවසායක සේවකයකු අමාත්‍යාංශයක හෝ වෙනත් ආයතනයක් වෙත නිදහස් නොකළයුතු බවත් අදාළ අනුමැතීන් මත නිදහස් කළහොත් එසේ නිදහස්කරන කාලයට අදාළව කිසිදු ගෙවීමක් සිදුනොකළ යුතු වුවද අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව මහාමාර්ග අමාත්‍යාංශයට සේවකයින් 07 දෙනෙකු නිදහස්කර 2023 වර්ෂය තුළදී වැටුප්, අතිකාල හා සංයුක්ත දීමනා ලෙස රු. 4,384,439 ක් ගෙවා තිබූ අතර එම අනුකූල නොවූ ගෙවීම් සමාලෝචිත වර්ෂය අවසන් වනතුරු වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකරගෙන නොතිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරිය වෙත සේවකයින් බඳවාගනු ලබන්නේ අධිකාරියේ අවශ්‍යතාවය මත වුවද සේවා අවශ්‍යතාවය මත නිළධාරීන් අනුයුක්ත කර ඇත. රේඛීය අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීමට අමාත්‍යාංශ ලේකම් ගේ අනුමැතියට යටත්ව ව්‍යාපෘති කළමනාකරණ ඒකක වෙත අනියුක්ත කර ඇත. මොවුන් අධිකාරිය මගින් බඳවා ගත් නිලධාරීන් / සේවකයන් වන බැවින් ඔවුන්ට වැටුප්, අතිකාල හා ගමන් වියදම් අධිකාරිය විසින් ගෙවා ඇත. | වක්‍රලේඛයට අනුකූල නොවන පරිදි අධිකාරියේ සම්පත් වෙනත් ආයතන වෙත ලබා දී ඔවුන්ගේ වියදම් අධිකාරියේ දැරීමට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රයේ ii කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව පරීක්ෂණයක් සිදු කර විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| vi. | 6.6 ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි. | මේ වන විටත් ගිණුම් විගණකාධිපති වෙත දින 60 ක් ඇතුළත ඉදිරිපත් කර ඇති අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඓ) | 2023 මැයි 16 දිනැති අංක අමප/23/0738 /607/051 දරන අමාත්‍ය මණ්ඩල තීරණය. | මාර්ග කි.මී.100,000 ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අධිකාරියට අයත් නොවන මාර්ග අදාළ ආයතන වෙත පවරා දීමට වැඩ පිළිවෙලක් සකස්කර ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මේ වන විට වැඩ නිම කරන ලද අධිකාරියට අයත් නොවන මාර්ග 5,345 න් මාර්ග 5,125 ක් අදාළ පළාත් පාලන ආයතන වෙත නැවත භාර දීම අධිකාරිය මගින් සිදු කර ඇත. | ඉදිකර ඇති මාර්ග පිරිවැය අදාළ පළාත් පාලන ආයතන වෙත විධිමත්ව පැවරීමට හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ) ඡේදය යටතේ වූ සමාලෝචනයේදී මෙම ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂ අවධානය යොමුකර අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පරිපාටීන් හඳුන්වා දී ලිඛිත උපදෙස් නිකුත් කර අධීක්ෂණය කළ යුතුය. |
| (ඔ) | 2005 නොවැම්බර් 03 දිනැති අංක: අමප/05/1711 /016/110 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබූ මාර්ග නඩත්තු කිරීමේ භාරකාර අරමුදලක් පිහිටු වීමට කටයුතු කර නොතිබුණි | මාර්ග නඩත්තු භාරකාර අරමුදල පිහිටුවීම සඳහා සකසන ලද වාර්තාව මහාමාර්ග අමාත්‍යාංශය හරහා මහාභාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇතත් ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග මහා භාණ්ඩාගාරය මඟින් ගෙන නොමැත. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මාර්ග නඩත්තු භාරකාර අරමුදලක් පිහිටුවීමට වගකිව යුතු පාර්ශවයන් විසින් නොපමාව කටයුතු කළ යුතුය |
| (ඕ) | 2023 පෙබරවාරි 06 දිනැති අංක 23/0256/604/ 030 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය සඳහා වූ රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුවේ (PERC) සාමාන්‍ය නිර්දේශ | | | |

| | | | | |
|---|---|---|---|---|
| i. | නිර්දේශ අංක 05 | මාර්ග සංවර්ධනය සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ කටයුතු අධිවේගී මාර්ග ජාලයට සහ ජාතික මාර්ග වලට පමණක් (A & B පන්තියට) සීමා විය යුතු බව දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂයේ කි.මී 1500 ව්‍යාපෘතිය සඳහා ලබා දුන් ප්‍රතිපාදන ලෙස රු.මිලියන 12,700.95 කින් රු.මිලියන 11,007.27 ක් ප්‍රතිශතයක් ලෙස 87% ක් අධිකාරියට අයත් නොවන මාර්ග ඉදිකිරීම් වෙනුවෙන් වැය කර තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් රජයේ අරමුදල් ප්‍රතිපාදනය කළ අරමුණට පරිබාහිරව වියදම් කර තිබුණි. | අංක MF/NB/CM/01/2024/117/01 හා 2024.01.08 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව අදාළ කටයුතු සිදු කර ඇත | අධිකාරියේ විෂය පථයට අදාළ මාර්ග නඩත්තු කිරීමටත් ලැබු ප්‍රතිපාදන ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට ඵලදායීව යෙද වීමටත් කටයුතු කළ යුතුය. |
| ii. | නිර්දේශ අංක 13 | අධිකාරිය යටතේ සියළු මාර්ග වල සංචලනය සම්බන්ධයෙන් දත්ත ඇතුළත් ඒකාබද්ධ මධ්‍යම දත්ත ගබඩාවක් ස්ථාපිත කර සංවර්ධන අරමුණු සඳහා අවශ්‍ය දත්ත සංචලනය සම්බන්ධ ඕනෑම රාජ්‍ය ආයතනයකට ප්‍රවේශ වීමේ හැකියාව අධිකාරිය විසින් සැපයිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනු ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අධිකාරිය යටතේ සියළු මාර්ගවල සංචලනය සම්බන්ධ දත්ත ඇතුළත් ඒකාබද්ධ මධ්‍යම දත්ත ගබඩාවක් ස්ථාපිත කළ යුතුය. අතර මෙම ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂ අවධානය යොමුකර අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පරිපාටීන්ද හඳුන්වා දිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ සමස්ත මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 31,548 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 80,232 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 48,684 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රාග්ධන ආදායම පෙර වසරට සාපේක්ෂව රු.මිලියන 68,374 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවා ඇති සමස්ථ ණය ශේෂය රු.මිලියන 321,569ක් වූ අතර එය රු.මිලියන 233,054 ක බැංකු ණය වලින් හා රු.මිලියන 88,515 ක ණයකර වලින් සමන්විත විය. මාර්ග කිලෝමීටර් 100,000 වැඩසටහන, අධිවේගී මාර්ග ඉදිකිරීම, මහා මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම හා අධිකාරියේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් මෙම ණය ලබාගෙන තිබූ අතර ණය සඳහා පොලිය බර තබන ලද ප්‍රාථමික ණය අනුපාතයට සියයට 2 සිට 2.8 වැනි පරාසයක අගයක් එකතුකොට නියම කොට තිබුණි. මෙම සියලු ණය ලබා ගැනීමේ දී භාණ්ඩාගාර ඇපකර නිකුත් කර තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| අයිතමය | 2023 (රු.) | 2024 (රු.) | වෙනස (රු.) | වෙනසේ ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| ප්‍රාග්ධන ප්‍රදාන | 218,359,010,726 | 148,289,456,646 | 70,069,554,080 | 32.09 |
| අධිවේගී මාර්ග ශුද්ධ ආදායම් | 3,731,323,463 | 5,231,660,693 | 1,500,337,230 | 40.21 |
| සංවර්ධන හා නඩත්තු වියදම් | 14,334,074,788 | 22,249,219,328 | 7,915,144,540 | 55.22 |

සමාලෝචිත වර්ෂයේදි ප්‍රාග්ධන ප්‍රදාන සියයට 32 කින් අඩු වි තිබුණු අතර නඩත්තු හා වැඩිදියුණු කිරීම් සඳහා දරන ලද වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 55.22 කින් ඉහළ ගොස් තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය 1:1 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ශුද්ධ අතිරික්තය පෙර වසර සමඟ සැසඳීමේ දී සියයට 19.17 ක අඩුවීමක් නිරූපනය වන අතර ඒ සඳහා ප්‍රාග්ධන ප්‍රදාන රු. මිලියන 68,374 කින් අඩුවීම හා පොලී ආදායම රු.මිලියන 535 කින් පහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය සතු ගැටලුකාරී තත්ත්වයන් පවතින වාහන සම්බන්ධව පරීක්ෂා කර බලා වාර්තාවක් ලබා දීම සඳහා පත් කරන ලද කමිටුවේ සාමාජිකයින් වෙත 2022 ඔක්තෝබර් 03 දින සිට 2023 පෙබරවාරි 23 දින දක්වා කාලයට අදාළව රු.මිලියන 2.78 ක් ගෙවීම් කර තිබුණද, එම වාර්ථාව මගින් සිදුකළ නිර්දේශයන් සමාලෝචිත වර්ෂය අවසන්වන විටත් ක්‍රියාත්මක කිරීමට අධිකාරිය විසින් කටයුතුකර නොතිබුණි. | වාහන වත්කම් ලේඛන යාවත්කාලීන කරමින් පවතින අතර මූල්‍ය අංශය විසින් පවත්වා ගෙන යනු ලබන වත්කම් ලේඛනය හා යාන්ත්‍රික අංශය මගින් පවත්වා ගෙන යන වත්කම් ලේඛනය සැසඳීම් කර අදාළ ගැලපීම් ද මේ වන විට සිදු කරමින් පවතී. | කමිටු වාර්තාවේ නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් සහිතව කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | දක්ෂිණ අධිවේගී මාර්ගයේ පින්නදූව සිට කොට්ටාව දක්වා කොටස මෘදු බිම් ප්‍රදේශ (Soft Ground Areas) හරහා දිවෙන බැවින් වර්ෂ 07 ක කාලයෙන් පසු Asphalt Overlaying කිරීම සිදු කළ යුතු බව හඳුනා ගෙන තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම මාර්ගය ඉදිකර වර්ෂ 13 ක් ගත වුවද එම කාර්යය සිදු කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පියවර ගෙන නොතිබුණි. | රට තුළ පැවති කොවිඩ් අර්බුධය හා මූල්‍ය අර්බුදය හේතුවෙන් මෙම කාර්යය පමාවීම හා මන්දගාමී වීම සිදු වුවද මේ වන විට කොට්ටාව සිට දොඩංගොඩ දක්වා කොටසේ පෙරමුසු ඇතිරීමට අදාළව ප්‍රසම්පාදන කටයුතු සිදු කෙරෙමින් පවතින අතර මෙම වසර අවසාන වන විට මෙම කොන්ත්‍රාත්තුව පිරිනැමීමට අපේක්ෂිතව ඇත. | අදාළ මාර්ග අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර අවශ්‍ය ක්‍රියාමාර්ග නොපමාව ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දක්ෂිණ අධිවේගී මාර්ගයෙහි දැනට භාවිතා කරන අයකැම් පද්ධතිය 2011 වර්ෂයේ තාවකාලිකව ස්ථාපිත කරන ලද පද්ධතියක් වූ අතර, නවීන තාක්ෂණය අනුව, ගෙවීම් සිදු කළ හැකි මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අධිකාරිය කටයුතු කර නොතිබූ අතර, අධිවේගී මාර්ග වලින් පිට වීමේ ගේට්ටු වැසීම හා විවෘත කිරීමේ ස්වයංක්‍රීය ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට සැලසුම්කර තිබුණද, එවැනි ක්‍රමවේදයක්ද ස්ථාපිතකර නොතිබුණි. | කොට්ටාව සිට කඩවත දක්වා ස්වයංක්‍රීය ගේට්ටු පරිපාලන පද්ධති නවීකරණය කර ඇත. කහතුඩුවේ සිට ගොඩගම දක්වා ස්වයංක්‍රීය ගේට්ටු පරිපාලන පද්ධති 2025 ජූලි මස අවසන් වන විට සම්පූර්ණ කිරීමට නියමිතව ඇත. එවිට 2025 ජූලි මස අවසන් වන විට කඩවත සිට ගොඩගම දක්වා සියලුම අන්තර් හුවමාරු වල ස්වයංක්‍රීය ගේට්ටු ස්ථාපිත කිරීමට නියමිතව ඇත. | නවීන තාක්ෂණයෙන් යුතු පද්ධති ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් අවධානය යොමුකර එම කාර්යයන් සිදු කිරීමට නොපමාව කටයුතු කළ යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ) ඡේදය යටතේ වූ සමාලෝචනයේදී මෙම ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂ අවධානය යොමුකර අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පරිපාටීන් හඳුන්වා දී ලිඛිත උපදෙස් නිකුත්කර අධීක්ෂණය කළ යුතුය. |
| (ඈ) | අධිවේගී මාර්ග පරිශීලක ගාස්තු තීරණය කිරීමට අදාළව ස්ථාවර ගාස්තුව ගණනය කර තිබුණේ අපේක්ෂිත ආයෝජනය නැවත අය කර ගැනීමේ වර්ෂ 30 ක කාලය තුළ (Target Period of Investment Recovery) ඇස්තමේන්තුගත වාර්ෂික මෙහෙයුම් වියදම්, වර්ෂය තුළ සියළු ඇතුල්වීමේ ගේට්ටු තුළින් අධිවේගී මාර්ගයට ඇතුළු වන අපේක්ෂිත වාහන සංඛ්‍යාවෙන් බෙදීමෙන් වන අතර, අපේක්ෂිත ආයෝජනය නැවත අයකර ගැනීමේ කාලය තුළ මුළු ඉදිකිරීම් පිරිවැය සහ දැරීමට සිදුවන නඩත්තු වියදම් වටිනාකම, එම කාලය තුළ ඇතුළු වන මුළු වාහන ධාවනය කරන කි.මී ගණන බෙදීමෙන් ලැබෙන රේටය විචල්‍ය ගාස්තුව ලෙස ගණනය කර තිබුණි. ඒ අනුව කොට්ටාව කඩුවෙල (OCH) අධිවේගී මාර්ගයට අදාළව වාර්ෂික මෙහෙයුම් වියදම් (Operation cost During the recovery Period) රු.මිලියන 46 ක් ලෙසත් මුළු වාහන ඇතුළුවීම් 131,155,450 ක් සිදුවේ යැයි උපකල්පනය කර තිබුණු අතර, දක්ෂිණ අධිවේගී මාර්ගයට (කොට්ටාව සිට මාතර දක්වා) අදාළව වාර්ෂික මෙහෙයුම් වියදම් රු.මිලියන 1,000 ක් ලෙසත් මුළු වාහන ඇතුළු වීම් 974,958,800 ක් සිදු වෙතැයි උපකල්පනය කර තිබුණද, 2024 | අධිවේගී මාර්ග පරිශීලක ගාස්තු 2023 මැයි මසදී සංශෝධනය කර ඇත. | වඩාත් තාර්කිකව සහ නිවැරදිව ආයෝජන මුදල් ඵලදායීව ආවරණය වන පරිදි ස්ථාවර ගාස්තු තීරණය කිරීමට අදාළ බලධාරීන් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේ පමණක් එම අධිවේගී මාර්ග දෙකෙහි මෙහෙයුම් වියදම් රු.මිලියන 2,220.48 ක් වී තිබුණි. ඒ අනුව සැලසුම්කළ පරිදි මෙහෙයුම් වියදම් පාලනය කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඉ) | 2019 නොවැම්බර් මස සිට 2024 ජුලි දක්වා වූ වර්ෂ 04 මාස 09 ක් තුළ ප්‍රවේශ ටිකට් පත් (Entry Tickets) 133,840,213 ක් නිකුත් කර තිබුණු අතර ඉන් වාහන 18,291,430 ක් සඳහා පිටවීමේ ටිකට් පත් (Exit Ticket) නිකුත් කර නොතිබීම හේතුවෙන් එම කාලය තුළ අධිවේගී මාර්ගයන්හි ගමන්කළ වාහනයකින් අයකළ සාමාන්‍ය ගාස්තුව පදනම් කරගෙන සිදු කළ ගණනය කිරීම් අනුව, අධිකාරියට අහිමි වූ ආදායම දළ වශයෙන් රු. මිලියන 4,614.47 ක් පමණ වන අතර දෛනික ආදායම් අහිමි වීම රු.මිලියන 01 ට ආසන්න වි තිබුණි. ඒ අනුව අධිවේගී මාර්ග ආදායම් විවිධ උපක්‍රම භාවිතාකර සාවද්‍ය පරිහරණයට හා වංචාවන්ට ලක්කර තිබුණු නමුත්, වගකිව යුතු මුදල් අයකැම්වරුන් ඇතුළු කාර්ය මණ්ඩලය හඳුනාගෙන විනයානුකූලව කටයුතු කිරීමට හා එම අඩුපාඩු වලක්වා ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමට අධිවේගී මාර්ග කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි. | අධිවේගී මාර්ග පද්ධතිය තුල දිනකට අසම්පූර්ණ ටිකට්පත් 3600 ක් පමණ නිකුත් වේ. ඉන් අසම්පූර්ණ ටිකට්පත් 1700 ක් කෙළවරපිටිය අන්තර් හුවමාරුවෙන් පමණ දිනකට නිකුත් වේ. දැනට පවතින තත්වය මත එම අසම්පූර්ණ ටිකට්පත් ප්‍රමාණය අවම කර ගැනීමට ද නොහැකි වී ඇති අතර අසම්පූර්ණ ටිකට්පත් සියල්ලම ආදායම් උපදින ටිකට්පත් නොවනු ඇත. | ආයතන සංග්‍රහයේ II කොටස XLVII පරිච්ඡේදයේ 8 වගන්තිය ප්‍රකාරව මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. එසේම 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ) ඡේදය යටතේ වූ සමාලෝචනයේදී මෙම ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂ අවධානය යොමුකර අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පරිපාටීන් හඳුන්වා දීමට හා අධීක්ෂණයට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2019 වර්ෂයේ සිට වසර 04 මාස 09 ක කාල සීමාව තුළ ප්‍රවේශ වීමේ කවුළුවේ සිටි අයකැම්වරුන් විසින් තම අභිමතය පරිදි හෝ නොසැලකිල්ල හේතුවෙන් වාහනයේ වර්ගය වෙනස් කරන(Category Change) ලද ටිකට්පත් 241,964 ක් නිකුත් වී තිබුණි. මෙවැනි අවස්ථා පාලනය කිරීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර පාලනයක් හඳුන්වා දී නොතිබීම හේතුවෙන් 2019 වර්ෂයේ සිට මේ දක්වා ඒවැනි දෝෂ වාර්තා වීමේ ප්‍රවණතාවය (Trend) වර්ධනය වී තිබුණි. | ගැලනිගම CCTV අංශය සහ එක් එක් අත්තර් හුවමාරු වල පවතින පහසුකම් අනුව CCTV අහඹු ලෙස නිරීක්ෂණය කරන අතර අදාළ වාහන category නිවැරදි නොවීම් වාර්තා වුවහොත් ඒ සම්බන්ධව අදාළ අයකැමින් හට වාචිකව හා ලිඛිතව අවවාද කර පසුව විනය ක්‍රියාමාර්ගද ගෙන ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ) ඡේදය යටතේ වූ සමාලෝචනයේදී මෙම ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂ අවධානය යොමුකර අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පරිපාටීන් හඳුන්වා දීමට හා අධීක්ෂණයට නොපමාව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ල) | අධිවේගී මාර්ග පද්ධතිය ඉදි කිරීම සඳහා දේශීය හා විදේශීය වශයෙන් රු.මිලියන 611,374 ක ණය මුදල් ලබා ගෙන තිබුණු අතර අධිවේගී මාර්ග සාමාන්‍ය වාර්ෂික ශුද්ධ ලාභය රු.මිලියන 3560.62 ක් විය. ඒ අනුව ණය මුදල් පමණක් (පොලිය හැර) ගෙවීමට ගතවන කාලය වර්ෂ 171 කට වැඩි බව නිරීක්ෂණය විය. ඒ අනුව ණය සහ පොලී ගෙවීම් මෙම අධිවේගී මාර්ග ආදායමින් ආවරණය කර ගැනීමට නොහැකි බව විගණනයේදී නිරීක්ෂණය විය. | පොදු මහජන සුභසාධන අරමුණින් අධිවේගී මාර්ග සඳහා වන ගාස්තු අවම පිරිවැයකට නියම කර ඇති අතර එම ආදායමින් ණය වාරික හා පොලී ගෙවීම සිදු කළ නොහැකි නිසා මහා භාණ්ඩාගාරයෙන් අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීම සිදු කරනු ඇත. | නව තාක්ෂණය උපයෝගී කර ගනිමින් මෙහෙයුම් වියදම් අඩු කිරීම සහ ආදායම් තවදුරටත් වර්ධනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ) ඡේදය යටතේ වූ සමාලෝචනයේදී මෙම ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂ අවධානය යොමුකර අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පරිපාටීන් හඳුන්වා දී ලිඛිත උපදෙස් නිකුත් කර අධීක්ෂණයව කළ යුතුය. |
| (ළු) | 2009 දෙසැම්බර් 31 දින එක් යන්ත්‍රයක් රු.මිලියන 40.62 ක් බැගින් එකතුව රු.මිලියන 365.60 කට මිලදී ගත් Bitumen Sprayer යන්ත්‍ර 09 ක් දීර්ඝ කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව රඳවාගෙන තිබුණු අතර අදාළ යන්ත්‍ර වල භාවිතය හා කාලය පිළිබඳ තොරතුරුද විගණනය වෙත ඉදිරිපත් නොවීය. | මෙහි සඳහන් Sprayer යන්ත්‍ර 09 අධිකාරිය සතු වන අතර ඉන් 02 ක් යාපනය හා පැල්මඩුල්ල යන ප්‍රදේශවල භාවිතා කරනු ලබයි. වර්තමානයේ මාර්ග සඳහා ගල් අතුරා තාර දැමීමේ ක්‍රියාවලිය එතරම් ප්‍රචලිත නොවන අතර කුඩා මාර්ග පවා කාපට් අතුරා නිම වන බැවින් මෙම බවුසර් රථ සඳහා ඉල්ලුමක් නැති අතර තව දුරටත් අවශ්‍ය නොවේ නම් ඉදිරියේදී අපහරණය කිරීමට කටයුතු කරනු ඇත. | ආයතන සංග්‍රයේ II කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර නිෂ්කාර්ය වත්කම් භාවිතා නොකරන්නේ නම් අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඎ) | ජනාධිපති කාර්ය සාධන බලකාය විසින් එක් යන්ත්‍රයක රු.මිලියන 31.57 (276,040.69USD*114.4) ක් වූ Aggregate Chip Spreaders යන්ත්‍ර 11 ක්, 2010 වර්ෂයේ දී රු.මිලියන 347.37 කට ආනයනය කර අධිකාරිය වෙත ලබා දී තිබුණි. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නඩත්තු කරන මාර්ග කාපට් ඇතිරූ A සහ B කාණ්ඩයේ මාර්ග වීම හේතුවෙන් මෙම වර්ගයේ යන්ත්‍ර වල අවශ්‍යතාවය මතු වී නොතිබුණු නමුත්, ඒවා භාවිතාකරන පලාත් සභා හෝ පලාත් පාලන අයතන වෙත එම යන්ත්‍ර පවරාදීමට කටයුතු නොකර වර්ෂ 14 ක් නිශ්කාර්යව අධිකාරිය යටතේ රඳවාගෙන 2024 වර්ෂයේ දී රු.මිලියන 9.36 ක | මෙම Aggregate Chip Spreaders යන්ත්‍ර 11 භාවිතා කරනු ලබන්නේ ගල් තාර ක්‍රමය යටතේ DBST මාර්ග සෑදීමටයි. නමුත් අධිකාරිය යටතේ පවතින A,B කාණ්ඩ දෙකෙහි පාරවල් සඳහා මෙම ගල් තාර ක්‍රමය භාවිතා කිරීම ඉතා සීමිත වූ අතර ඒ සඳහා කාපට් ඇතිරීම සිදු කරයි. තවද ඉහත සඳහන් Aggregate Chip Spreaders යන්ත්‍ර වල පළල මීටර් 4.2 ක් වන බැවින් අධිකාරිය පළාත්සභා හෝ පළාත් පාලන ආයතන මගින් නඩත්තු කරනු ලබන පටු මාර්ග සඳහා මෙම යන්ත්‍ර භාවිතා කළ නොහැක. | ආයතන සංග්‍රයේ II කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර නිෂ්කාර්ය වත්කම් භාවිතා නොකරන්නේ නම් අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වටිනාකමකට අපහරණය කර තිබුණි. | එබැවින් මෙම යන්ත්‍ර වෙනත් කිසිදු ආයතනයකට පවරා දීම නිෂ්ඵල කාර්යක් බැවින් අපහරණය කර ඇත. | |
| (සaa) | අධිවේගී මාර්ග කළමනාකරණ හා නඩත්තු අංශය විසින් කොවිඩ්-19 වසංගත අවස්ථාවේ දී, ආරක්ෂිත පියවරක් ලෙස මිලදී ගනු ලැබූ රු.මි. 2.88 ක් වූ ආරක්ෂක කුටි 33 ක් කොවිඩ්-19 වසංගත තත්වයෙන් පසුවද, කාසි ගණන් කිරීමේ යන්ත්‍ර 20 ක් හා බර මැනීම සඳහා භාවිතා කරනු ලබන යන්ත්‍ර 05 ක් අධිකාරිය වෙත මිලදී ගත් දින සිටද නිෂ්කාර්යව පැවතුණි. | කොවිඩ් වසංගතය අවසන් බැවින් එම කොවිඩ් විෂබීජ හරණ කුටි 33 භාවිතයෙන් ඉවත් කොට ඇති අතර ආරක්ෂිත මුරකුටි තැනීම සහ නඩත්තු අංශයේ නඩත්තු වැඩ කටයුතු සඳහා මේ වන විට යොදාගෙන ඇත.<br>කාසි ගණන් කිරීමේ යන්ත්‍ර 20 වෙන්දේසි කිරීම සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.<br>ගබඩාවෙහි ඇති බර මැනීමේ යන්ත්‍ර අනුමැතියට යටත්ව අපහරණය කිරීමට හෝ අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට අපේක්ෂිතව ඇත. | ආයතන සංග්‍රයේ II කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර නිෂ්කාර්ය වත්කම් භාවිතා නොකරන්නේ නම් අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (එ) | 1995 වර්ෂයේ දී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත බාරදී ඇති බවට වාර්තා කර ඇති ට්‍රැක්ටර් 14 ක් සහ ට්‍රේලර් 18 ක් අයිතිය විධිමත් ව බාරදීමට හෝ නැවත පවරා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් තවදුරටත් අදාළ වාහන මාර්ග සංවර්ධන අධිකාරිය නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු පරිගණක පද්ධතියේ පැවතුණි. | මොටර් රථ ප්‍රවාහන කොමසාරිස් සමඟ කරන ලද සාකච්ඡා අනුව එම වාහන වල ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා එම ලිපි ප්‍රමාණවත් නොවන බව දන්වා සිටින ලදී. එබැවින් ඉහත ට්‍රැක්ටර් 13 ක් සහ ට්‍රේලර් 19 පිළිබඳව අධිකාරිය විසින් පොලිස් පැමිණිලි ගොනු කර ඇත. | අදාළ ට්‍රැක්ටර් හා ටේ්‍රලර් යුධ හමුදාව වෙත පැවරීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ඒ) | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මාර්ග සංවර්ධන අධිකාරිය නමින් ලියාපදිංචි වී ඇති අංක 40-8641 හා අංක 26-6492 දරන වාහන 02 පිළිබඳ කිසිදු තොරතුරක් අධිකාරිය පවත්වාගෙන ගොස් නොතිබුණි. ඒ අනුව අදාළ වාහන බාහිර පාර්ශවයන් වෙත පැවරීමක් හෝ අවභාවිතා වීමක් සිදු වී තිබේ ද යන්න අනාවරණය කර ගැනීමට මාර්ග සංවර්ධන අධිකාරියේ වාහන පාලනය පිළිබඳ වගකිව යුතු නිලධාරීන් කටයුතු කර නොතිබුණි. | ඒ පිළිබඳව පරීක්ෂා කර බලා ඉදිරියේදී අවශ්‍ය පියවර ගනු ඇත. | ආයතන සංග්‍රහයේ II කොටස XLVII පරිච්ඡේදයේ 8 වගන්තිය ප්‍රකාරව මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග නොපමාව ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඓ) | නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා කණු මතින් ඉදි වන අධිවේගී මාර්ග ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වන අනවසර පවුල් 1100 ක් සඳහා නිවාස ලබා දීම වෙනුවෙන් 2021 වර්ෂයේ සිට 2025 දක්වා වාරික 05 කින් රු.මිලියන 2388.85 ක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවීමට 2021 ජූලි 14 දින ගිවිසුම් ගත වී තිබුණු අතර, අදාළ නිවාස කොලොන්නාව, මාලිගාවත්ත සහ හේනමුල්ල නිවාස ව්‍යාපෘති මගින් ලබා ගැනීමට සැලසුම්කර තිබුණි. 2024 අගෝස්තු 23 විගණිත දින විට එකතුව රු.මිලියන 960 ක් වූ වාරික 02 ක් ගෙවා අවසන් කර, 03 වන වාරිකය වූ රු.මිලියන 480 ක් ගෙවීමට නියමිතව තිබූ නමුත් කිසිදු නිවාසයක් අධිකාරිය වෙත භාර ගැනීමට මේ දක්වා කටයුතුකර නොතිබුණි. | අදාළ නිවාස ඒකකයන්හි තිබූ අඩුපාඩු සැකසීම සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදීම නාගරික සංවර්ධන අධිකාරිය දැනුවත් කළ නමුත් , ඒ සඳහා නිසි ප්‍රතිචාර නොලැබුනු බැවින් එම නිවාස, අධිකාරිය වෙත භාර ගැනීම සිදු කර නොමැත. | ගිවිසුම් ප්‍රකාරව නිවාස නාගරික සංවර්ධන අධිකාරියේ ලබා ගැනීමට සහ අධිකාරිය වෙත විධිමත්ව නිවාස පවරාගෙන හඳුනාගත් අනවසර පදිංචිකරුවන් සඳහා නිවාස ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (ඔ) | පුද්ගලික ආයතනයකට 2011 නොවැම්බර් 18 වන දින ලබා දී තිබූ රු.මිලියන 05 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවා නොතිබුණු අතර අත්තිකාරම් ලබා දීමට අදාළව ප්‍රසම්පාදන කමිටු වාර්තා, තාක්ෂණික කමිටු වාර්තා මෙන්ම එම කාර්ය ඉටු කිරීම සඳහා අත්තිකාරම් මුදල් ලබාදීමේ දී අදාළ ආයතනය විසින් අධිකාරිය වෙත තබා ඇති බැදුම්කරය පිළිබඳ තොරතුරු හා අදාළ ආයතනය හා අධිකාරිය අතර ඇති කරගත් ගිවිසුම් සම්බන්ධ වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි. | මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දක්ෂිණ අධිවේගී මාර්ගයේ ආරම්භක උත්සවයට මෙම මුදල මහාමාර්ග අමාත්‍යාංශයේ උපදෙස් අනුව අත්තිකාරම් මුදලක් වශයෙන් මෙම මුදල ලබා දුන් බැවින් අදාළ ආයතන සමග ඇති කර ගත් ගිවිසුමක්, බැඳුම්කරයක්, ප්‍රසම්පාදන කමිටු වාර්තා හෝ තාක්ෂණික කමිටු වාර්තා නොමැත. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් ආයතන සංග්‍රයේ II කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ) ඡේදය යටතේ වූ සමාලෝචනයේදී මූල්‍ය බලතල බෙදා හැරීම සම්බන්ධ විශේෂ අවධානය යොමුකර අවශ්‍ය පරිපාටීන් හඳුන්වා දී ලිඛිත උපදෙස් නිකුත්කර අධීක්ෂණය කළ යුතුය. |
| (ඕ) | කුරුණෑගල සිට දඹුල්ල දක්වා කිලෝ මීටර් 58.6 ක් වූ මධ්‍යම අධිවේගී මාර්ග කොටසෙහි ඉඩම් අත්කර ගැනීමේ කටයුතු 2015 වර්ෂයේ දී ආරම්භ කර 2023 දෙසැම්බර් මස වන විට අවසන් කළ යුතුව තිබුණි. ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 38(අ) වගන්තිය යටතේ හෙක්ටයාර් 475 ක් වූ බිම් ප්‍රමාණයක් අත්පත් කරගෙන තිබුණි. 2023 ජූනි 13 දින මෙම ඉඩම් සම්බන්ධ | ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලියට අනුව ඉඩම් කැබලි 615 න් 351 විහාර දේවාලගම් පනතට අයත් ඉඩම් කැබලි වූ නිසා බලපෑමට ලක්වන පාර්ශවයන් වෙත සහන සැලසීම සඳහා අමප/21/1051/319 හා 2021.06.08 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව කටයුතු කරනු ලැබේ. කැබලි | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් මේ සම්බන්ධයෙන් පරීක්ෂාකර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතු අතර අරමුදල් සම්පාදනය කිරීමේ හැකියාව සහ නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර ව්‍යාපෘති ආරම්භ කිරීමට |

| | | | |
|---|---|---|---|
| | ඉදිරි කටයුතු මාර්ග සංවර්ධන අධිකාරියට වෙත පවරා දී තිබුණු අතර ඒ වන විට, ඉඩම් අත්පත් පනතේ 07 වන වගන්තිය අනුව ප්‍රකාශයට පත් කළ මුළු කැබලි සංඛ්‍යාව 5505 න් පෞද්ගලික කැබලි සංඛ්‍යාව 3505 ක් ද රජය සතු කැබලි සංඛ්‍යාව 1550 ක් ද විය. පෞද්ගලික ඉඩම් කැබලි 3505 න් කැබලි 615 ක පනතේ 09 වන වගන්තිය පරිදි හිමිකම් පරීක්ෂණ සිදුකර නොතිබුණු අතර හිමිකම් පරීක්ෂණ සිදු කරන ලද කැබලි 2890 කින් කැබලි 469 ක් සඳහා 10 (1) වගන්තිය අනුව දැන්වීම නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. 10 (1) වගන්තිය නිකුත් කරන ලද කැබලි 2335 න් කැබලි 218 ක තක්සේරු වාර්තා ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. තක්සේරු වාර්තා ලැබුණු කැබලි 1571 න් කැබලි 863 කට අදාළව 17 වන වගන්තිය අනුව දැන්වීම ප්‍රකාශයට පත්කර නොතිබුණු අතර LARC කමිටු පැවැත්වූ කැබලි 928 න් 722 ක් සඳහා වන්දි හා පොලී ගෙවීම් කටයුතු අවසන් කර නොතිබුණි. | 2890 න් 469 ක් 10.1 වගන්තිය නිකුත් කිරීමටත් කැබලි 2335 න් 218 කට තක්සේරු වාර්තා ලබා ගැනීමටත් කටයුතු කර ඇත. කැබලි 1571න් 863 ක 17 වගන්තිය නිකුත් කර ඇති අතර කැබලි 928 න් 722 ක් සඳහා වන්දි හා පොලී ගෙවීම සිදු නොකිරීමට ඉහත කරුණු පදනම් වේ. | කටයුතු කළ යුතුය. තවද 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ) ඡේදය යටතේ වූ සමාලෝචනයේදී මේ සම්බන්ධ විශේෂ අවධානය යොමුකර අවශ්‍ය පරිපාටීන් හඳුන්වා දී ලිඛිත උපදෙස් නිකුත්කර අධීක්ෂණය කළ යුතුය. |
| (ඖ) | ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MPH/HWY/ADM/06/30/05/3 දරන හා 2024 අගෝස්තු 13 දිනැති ලිපියෙහි 01 වෙනි වගන්තිය හා 03 වගන්තිය අනුව කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ පිවිසුම් සහ පිටවීම් ස්ථාන වල ප්‍රථමයෙන් (ICS) විදුලි පහන් පද්ධතිය නැවත යථා තත්ත්වයට පත්කිරීම ඇස්තමේන්තු සකස් කිරීමට අපදෙස් ලබා දී තිබුණද සම්පූර්ණ මාර්ගයේ කි.මී 10 ක කොටස සඳහා වූ රු. මිලියන 708 ක ඉංජිනේරු ඇස්තමේන්තුවක් අනුමත කර ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් ආයතන සංග්‍රයේ ii කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ක) | කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය 2020 වර්ෂයේ සිට මහජනයාට විවෘත කර තිබූ අතර අධිවේගී මාර්ගයන්හී වැටෙහි මධ්‍ය තීරුවේ තඹ කම්බි කැපීම, විදුලි පහන් කණු කපා ගෙන යාම ආදී සොරකම් සිදු වී තිබූ බව වාර්තා වී තිබුණි. 2021,2022,2023 යන වර්ෂ 03 | අදහස් දක්වා නොමැත. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් ආයතන සංග්‍රයේ II කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| හී සිදුවී ඇති සොරකම් 100 න් සොරකම් 11 වටිනාකම රු.මිලියන 580 ක් ලෙස ගණනය කර තිබුණි. වාර්තා වී ඇති අනෙකුත් සොරකම් 89 ක වටිනාකම හඳුනා ගෙන නොතිබුණි. මෙම මාර්ගයේ මාර්ග විදුලි රැහැන් සැලසුම් කිරීමේ දී මධ්‍ය තීරුවේ එලා ඇති විදුලි රැහැන් පද්ධතිය සම්පූර්ණ කොන්ක්‍රීට් ආවරණයකින් තොරව අඩි 03 ක අඩකව විෂ්කම්භය සහිත හියුම් පයිප්පයක් මගින් (Hume Pipe) අර්ධ වශයෙන් ආවරණය කර තිබූ අතර එම සැලසුම් අනුව ඉතා පහසුවෙන් එම විදුලි රැහැන් කපා ඉවත් කර ගැනීමේ හැකියාවක් පැවතුණි. එම සැලසුම් කිරීමේ දෝෂය ද මෙසේ විදුලි රැහැන් සොරකම් කිරීමට හේතුවක් වී ඇති බව ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. පළමු සොරකම සිදුවූ 2021 වර්ෂයේ දී සුදුසු ආරක්ෂිත ක්‍රමවේදයක් හඳුන්වා නොදීම තුලින් හා වගකිව යුතු අධීක්ෂණ නිලධාරීන් ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් මාර්ගයේ විදුලි රැහැන් හා උපාංග සොරකම අඛණ්ඩව වර්ධනය වීමට හේතු වී තිබූ බව නිරීක්ෂණය විය. පළමු කි.මී.10 සඳහා සිදුකර ඇති ඇස්තමේන්තුව සමඟ සැසඳීමේදි සම්පූර්ණ මාර්ගයේ හානි පූර්ණ පිරිවැය රු.මිලියන 1770 ක් ඉක්මවන නමුත් ඒ සඳහා වගකිව යුත්තන් හඳුනාගෙන ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |

**3.2 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කි.මී 100,000 ක විකල්ප මාර්ග, අතුරු මාර්ග, ග්‍රාමීය මාර්ග පුනරුත්තාපනය සහ ක්‍රියාත්මක කිරීම යන මැයෙන් ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2023 දෙසැම්බර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ 4.1 ඡේදයේ සඳහන් පරිදි මාස 06 ක කාලසීමාවක් තුළ මාර්ග ආරක්ෂිතව ගමනාගමනයට සුදුසු තත්වය දක්වා වැඩි දියුණු කිරීමටත්, | අදහස් දක්වා නොමැත. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අතර මග නවතා ඇති මාර්ග පිළිසර කිරීම කර ගමනා ගමනයට සුදුසු තත්වයට පත්කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බවත්, අනුමැතිය නොලත් මාර්ග සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම පිළිබඳව වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් |

| | | | |
|---|---|---|---|
| | 2024 වර්ෂය සඳහා වෙන්කර තිබූ රු.බිලියන 28 ක ප්‍රතිපාදන මගින් රු.බිලියන 20 ක් ඒ සඳහා යෙදවීමටත් අනුමැතිය ඉල්ලා තිබුණු අතර 2024 මාර්තු 18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ඒ සඳහා අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව, 2024 වර්ෂයේ පළමු කාර්තු දෙක තුළ නිමකිරීම සඳහා ගිවිසුම් වලට එළඹි කොන්ත්‍රාත් පිරිවැය රු.මිලියන 562.48 ක්වූ මාර්ග 28 ක ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම කර නොතිබුණු අතර අදාළ මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතිය යටතේ සංවර්ධන කටයුතු ආරම්භ නොකළ මාර්ග විය. ඒ අනුව, උක්ත කොන්ත්‍රාත් සඳහා ගිවිසුම්ගත වූ වටිනාකම විධිමත් අධිකාරී බලයක් නොමැතිව සිදුකරන තිබුණි. | | ආයතන සංග්‍රහයේ II බාණ්ඩයේ XLVIII වන පරිච්ඡේදයේ 29 වන වගන්තිය අනුව, විනය පියවර ගත යුතුය. |

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සෑම ව්‍යාපෘති යෝජනාවක් ම නිසි ශක්‍යතා අධ්‍යන වාර්තාවක් සමඟ ඇගයීම සහ නිර්දේශ කිරීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු බවට 2019 දෙසැම්බර් 18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණද, ඒ අනුව කටයුතු නොකර මාර්ග කිලෝමීටර් 100,000 ව්‍යාපෘතිය යටතේ 2020-2022 කාල සීමාව තුළ දුර කි.මී. 17,847 කින් යුත් මාර්ග 13,160 ක් සඳහා රු.මිලියන 394,508.09 ක ඇස්තමේන්තු අනුයාත කොට කොන්ත්රාත්කරුවන් සමඟ ගිවිසුම් ගත වීමට හා 2024 සැප්තැම්බර් 30 දිනට රු.මිලියන 190,516.15 ක් වියදම් දැරීමට රේඛීය අමාත්‍යාංශ ප්‍රතිපාදන මත මාර්ග සංවර්ධන අධිකාරිය කටයුතු කර තිබුණි. | කි.මී. 100,000 ව්‍යාපෘතිය 2020 වසරේදී ආරම්භ කළ අතර පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්මක් යටතේ ක්‍රියාත්මක වූ අතර මෙම ක්‍රියාකාරී සැලැස්ම සඳහා කැබිනට් අනුමැති ලබා ගෙන ඇත (2020 දෙසැම්බර් 14 දිනැති අංක අමප/20/1952/319/018 දරන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම). මෙම අනුමත ක්‍රියාකාරී සැලැස්මට අනුව වාර්ෂිකව ව්‍යාපෘතිය සඳහා ලබා දෙන ලද ප්‍රතිපාදන සීමාවන් තුල එක් එක් වර්ෂයන් වලදී ව්‍යාපෘතියේ වැඩ පිරිනමා ඇත. | ශක්‍යතා අධ්‍යනයකින් පසුව පමණක් නව ව්‍යාපෘති ආරම්භකළ යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ) ඡේදය යටතේ වූ සමාලෝචනයේදී නව ව්‍යාපෘති ආරම්භකිරීම හා අරමුදල් සම්පාදනය පිළිබඳ විශේෂ අවධානය යොමුකර අවශ්‍ය පරිපාටීන් හඳුන්වා දී ලිඛිත උපදෙස් නිකුත්කර අධීක්ෂණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2020 සිට 2024 කාල සීමාවේදි මාර්ග කිලෝමීටර් 100,000 ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 215,981ක් වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන වෙන් කර තිබුණි. එම කාල සීමාව තුළ මාර්ග කි.මී 17,847 ක් සඳහා ඇස්තමේන්තු අනුයාත කොට කොන්ත්‍රාත්කරුවන් සමඟ රු.මිලියන 394,508 කින් යුත් බැඳීම් ඇති කරගෙන තිබුණු අතර අනුමත අයවැය ප්‍රතිපාදන ඉක්මවා මු.රෙ. 94 ට පටහැනිව රු.මිලියන 178,527 ක බැඳීම් ඇති කරගෙන තිබුණි. මු.රෙ. 127 (5) අනුව, ඇස්තමේන්තු වල ප්‍රතිපාදන මුදල් හා වියදම් අතර ඇති සැලකිය යුතු වෙනස් වීම් පරීක්ෂණයට භාජනය කෙරෙන බවට වූ ප්‍රධාන ගණන් දීමේ නිළධාරීගේ වගකීම් රේඛිය අමාත්‍යාංශ ලේකම් විසින් ඉටු නොකර අවිධිමත් ලෙස ඇති කර ගත් බැඳීම් පියවීමට ඉහල වාණිජ අනුපාතික ණය සහ සියයට 22.5 සහ 20 පොලී අනුපාතිකයන් යටතේ වර්ෂ 04 කින් කල්පිරෙන වටිනාකම රු.මිලියන 40,691.79 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර භාණ්ඩාගාරය විසින් නිකුත්කර තිබුණි. | වසර තුල ලබා දුන් ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා කිසිදු ගෙවීමක් සිදු කර නොමැති අතර 2022.04.26 මුදල් අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද වියදම් කළමනාකරණය කිරීමේ චක්‍රලේඛයට අනුව කොන්ත්‍රාත් සඳහා බැදීම් වල වටිනාකම රු.බිලියන 394.508 සිට රු. බිලියන 232 දක්වා අඩුකරන ලදී.<br>එලෙසම 2022 වසරේ දෙසැම්බර් සහ 2023 වසරේ පෙබරවාරි වලදී භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කරනු ලැබුවේ 2021 වසරේ සිට පැවැති අතැති බිල්පත් නිරාකරණය සඳහා වේ. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ) ඡේදය යටතේ වූ සමාලෝචනයේදී නව ව්‍යාපෘති ආරම්භකිරීම හා අරමුදල් සම්පාදනය පිළිබඳ විශේෂ අවධානය යොමුකර අවශ්‍ය පරිපාටීන් හඳුන්වා දී ලිඛිත උපදෙස් නිකුත්කළ යුතුය. |
| (ඇ) | 2019 දෙසැම්බර් 18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණය අනුව මාර්ග කිලෝමීටර් 100,000 ව්‍යාපෘතිය මගින් සංවර්ධනය කිරීමට ග්‍රාමීය මාර්ග හඳුනා ගැනීම සඳහා නිර්ණායකයන් 09 ක් යටතේ මාර්ග තෝරාගත යුතු වුවත් එලෙස මාර්ග කි.මී.17,648 ක් තෝරාගත් බවට වන තොරතුරු පවත්වාගෙන ගොස් නොතිබුණු අතර සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේදි අදාළ නිර්නායකයන්ට පටහැනිව බස්නාහිර පළාත් ව්‍යාපෘති කාර්යාලය , වයඹ හා උතුරු මැද පළාත් වල රු.මිලියන 1,426.67 ක් වැය කර පාසල්, පල්ලි හා පූජනීය ස්ථාන හා රාජ්‍ය ආයතන වලට අයත් අභ්‍යන්තර මාර්ගවල හා භූමිවල කාපට් ඇතිරීම, කොන්ක්‍රීට් යෙදීම, කැට ගල් ඇල්ලීම ආදී කාර්යයන් සිදු කර තිබුණි. | 2020.02.13 දිනැති අංක: අමප/20/0142/221/005 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතියෙහි සඳහන් වන්නේ ව්‍යාපෘතියේ මාර්ග තෝරා ගැනීමේදී ලකුණු ලබා දීමේ ක්‍රමවේදය අනුගමනය කරන ලෙසත්, ලකුණු සීමාව 40 ට වැඩි මාර්ග සඳහා ආරම්භයේදී මූලිකත්වය ලබා දෙන ලෙසත්ය. ඒ අනුව, කි.මී. 100,000 ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමේදි ව්‍යාපෘතියේ මාර්ග තෝරා ගැනීමට ලකුණු ලබා දීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක විය. ලකුණු 40 යන ප්‍රමාණයට අඩු අත්‍යාවශ්‍ය සහ ආර්ථික හා සමාජීය වශයෙන් වැදගත් මාර්ග, අමාත්‍යාංශ ලේකම් හා ඉහළ කළමණාකාරීත්වයේ අනුමැතිය සහිතව සෘජු කම්කරු ශ්‍රමය යටතේ සංවර්ධනය කිරීම සිදු කර ඇත. | ආයතන සංග්‍රයේ II කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මාර්ග කිලෝමීටර් 100,000 ව්‍යාපෘතියේ ඉංජිනේරු ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල නොකිරීම හේතුවෙන් නියැදි පරීක්ෂණය අනුව දිස්ත්‍රික්ක 06 ක්‍රියාත්මක කොන්ත්‍රාත්වලට අදාළ ඇස්තමේන්තු වටිනාකම 2021 අප්‍රේල් මස වන විට රු.මිලියන 3,504 කින් අධි ගණනය වී තිබුණද රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ 2022 ඔක්තෝබර් 03 දිනැති අංක MOH/SEC/GEN/2022/71 දරන "කොන්ත්‍රාත් මුදල සඳහා යෝජිත අඩු කිරීම් සම්බන්ධයෙන් පැන නැගුණු ආරවුල්" පිළිබඳ ලිපියට අනුව දැනටමත් ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්වල රේටයන් සංශෝධනය කිරීමට නොහැකි බව දන්වා තිබුණු බැවින් මෙම අධි ගණනය වීම් නිවැරදි කර නොතිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා රජයට සිදුවූ අලාභය මේ දක්වා නිවැරදි කර නොතිබුණු අතර අධි ඇස්තමේන්තුගත රේටයන් සංශෝධනය නොකිරීම මත පරිපාලන වියදම් සඳහා පමණක් ඇස්තමේන්තු කළ වටිනාකම රු.මිලියන 2,186.14 කින් අධිගණනය කර තිබුණි. ඒ අනුව ප්‍රදානය කරන ලද සියලු කොන්ත්‍රාත්වල සංශෝධනය නොකරන ලද අනෙකුත් රේට අධිගණනය වීම් සැලකූ විට මෙම අලාභය තවදුරටත් වැඩි වන බව විගණනයේදී නිරීක්ෂණය විය. | කි.මී. 100,000 ව්‍යාපෘතිය යටතේ කොන්ත්‍රාත් ප්‍රදානය සිදුකරන ලද්දේ තරඟකාරී ලංසු ක්‍රමය අනුගමනය කරමින් වේ. එලෙසම තරගකාරී ලංසු ක්‍රමය අනුගමනය කරමින් ලබාගන්නා ලද වට්ටම් මුදලක් මගින් කොන්ත්‍රාත් ප්‍රදානය සිදු කිරීම නිසා ඉංජිනේරු ඇස්තමේන්තුව මත පදනම්ව මෙම කොන්ත්‍රාත් ප්‍රදානය ගැන නිර්වචන සිදු කිරීම සාධාරණ නොවනු ඇත.<br><br>තවද කිලෝමීටර් 100,000 ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ප්‍රදානයන් සිදුකිරීමේදී ලබා ගන්නා ලද වට්ටම් වල මුළු වටිනාකම රු.මිලියන 7,200 ක් වන අතර ඒ අනුව කොන්ත්‍රාත් ගිවිසුම් ගතවී ඇත. මෙම වට්ටම් මුදල වැඩ බිමෙහි තත්ත්වය සැලකිල්ලට ගෙන කොන්ත්‍රාත්කරුවන් විසින් පිරිනමා ඇත. එම නිසා ඇස්තමේන්තුව මත රජයට අලාභයක් හෝ හානියක් සිදුවී නොමැත. | ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | අධිකාරියට අයත් සියලුම පළාත් කාර්යාලයන් හි ඉංජිනේරුවරුන් තාක්ෂණ සහයකවරුන්, තාක්ෂණ නිලධාරීන් සහ වැඩ අධිකාරිවරුන් 1148 ක සංඛ්‍යාවක් සිටියද, රාජකාරී පැවරීමේ ක්‍රියාවලිය විධිමත් ව සිදු නොකිරීම සහ දුර්වල අධීක්ෂණය හේතුවෙන් අවසාන කොන්ත්‍රාත් බිල්පත් ගෙවීම සඳහා දීර්ඝ කාලයක් ප්‍රමාද වූ අවස්ථාවන් නිරීක්ෂණය වූ අතර බිල්පත් ගෙවීම ප්‍රමාද වීම මත ප්‍රමාද ගාස්තු ලෙස රු.මිලියන 42.89 ක් ගෙවීම් කර තිබුණු බව මාර්ග කිලෝමීටර් 100,000 ව්‍යාපෘතිය පිළිබඳව නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය. | එබැවින් පවතින සීමිත සේවක පිරිස යටතේ කාර්යයන් ඉටු කිරීමේදී බිල්පත් පරීක්ෂා කටයුතුවල ප්‍රමාද වීම් සිදුවී ඇත. තවද ව්‍යාපෘතිය සිදුකරන අවස්ථාවේදී සිටි නිලධාරීන් ස්ථාන මාරු ලැබීම, විදේශගත වීම, විශ්‍රාම යෑම වැනි සිදුවීම් නිසාද නව නිලධාරීන් එම බිල්පත් පරීක්ෂා කිරීමට වැඩි කාලයක් යෙදවීම නිසාද ප්‍රමාද වීම් සිදුවී ඇත. | ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | මාර්ග කිලෝමීටර් 100,000 ව්‍යාපෘතිය සම්බන්දයෙන් මගනැගුම මාර්ග ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සමාගම විසින් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සේවා සැපයුම් ගිවිසුම් හි වගන්ති අංක 3(e) අනුව ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 10 කට නොඅඩු කාර්‍ය සාධන සුරක්ෂණයක් ලබාගත යුතු වුව ද, සමාගම විසින් උප කොන්ත්‍රාත්කරුවන් සඳහා ලබා දුන් වටිනාකම රු.මිලියන 125,730 ක් වූ වැඩ ඇණවුම් 1753 න් වැඩ ඇණවුම් 145ක් සඳහා පමණක් වටිනාකම රු. මිලියන 1,113 ක් වූ කාර්යසාධන සුරක්ෂණ ලබාගෙන තිබූ අතර ඒ අනුව ඉතිරි වැඩ ඇණවුම් 1608 ක් සඳහා සමාගම විසින් කිසිදු කාර්යසාධන සුරක්ෂණයක් ලබා නොගෙන වැඩ ආරම්භ කිරීමට කොන්ත්‍රාත්කරුවන්ට ඉඩ දී තිබුණි. | මහ නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ (පුද්) සමාගම ඉදිරිපත් කරන ලද සේවා සැපයුම් ගිවිසුම් පිළිබදව මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් නැත. | ආයතන සංග්‍රයේ II කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව මේ පිළිබද පරීක්ෂණයක් සිදු කර විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (උ) | විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු පරිදි 2025 පෙබරවාරි 28 දිනට වැඩ පූර්ව අත්තිකාරම් අයකර ගැනීමේ දී රු.මිලියන 16,785 ක් අන්තර් ගෙවීම් බිල්පත් වලින්ද, රු.මිලියන 2,812 කොන්ත්‍රාත්කරුවන්ගේ වෙනත් කොන්ත්‍රාත් සඳහා ගෙවීමට නියමිත බිල්පත් වලින් පියවා ගැනීමට හා රු.මිලියන 26 ක වැඩ පූර්ව අත්තිකාරම් බැදුම්කර මගින් අයකර ගැනීමට කටයුතු කර තිබුණි. තවද රු.මිලියන 2,812 ක් කොන්ත්‍රාත්කරුවන්ගේ වෙනත් බිල්පත් මඟින් පියවා ගැනීමට කටයුතු කර තිබුණද ඒ සඳහා ලබා ගත් විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවුණි. | අයකර ගැනීමට ඉතිරිව ඇති අත්තිකාරම් මුදල් එම කොන්ත්‍රාත් සමාගම විසින් ඉටු කරන ලද වෙනත් කොන්ත්‍රාත් මගින් පියවා ගැනීමට අදාළ අනුමැතිය ලබා ගෙන ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ) ඡේදය යටතේ වූ සමාලෝචනයේදී මෙම ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂ අවධානය යොමුකර අවශ්‍ය පරිපාටීන් හඳුන්වා දී ලිඛිත උපදෙස් නිකුත්කර අධීක්ෂණය කළ යුතුය. |
| (ඌ) | අංක 79/2023 දරන හා 2023 දෙසැම්බර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව අතරමඟ නවතා දමන ලද මාර්ග සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළ සඳහා වෙන් වූ රු.බිලියන 28 ක මුදල නැවතත් සංශෝධනය කර එම ප්‍රතිපාදන වටිනාකමින් රු.බිලියන 20 ක් මාර්ග කි.මි. 1500 වැඩි දියුණු කිරීමේ වැඩ සටහනට වෙන් කරදීමට යෝජනා කර තිබුණු අතර, මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති ඇමතිතුමාගේ | 2023 දෙසැම්බර් 11 වන දින අංක 79/2023 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව රු. බිලියන 08 ක් පමණක් කි.මී. 100,000 ව්‍යාපෘතිය මගින් ගෙවීමට ඉතිරිව පවතින හිඟ බිල්පත් පියවීමට යොදා ගැනීමට වෙන් කර තිබුණි. | වෙන් කරන ලද ප්‍රතිපාදන මුදල් අදාළ කාර්යයන් වෙනුවෙන් යෙදවීමට කටයුතු කළ යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ) ඡේදය යටතේ වූ සමාලෝචනයේදී මෙම ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂ අවධානය යොමුකර අවශ්‍ය පරිපාටීන් හඳුන්වා දී ලිඛිත |

| | | | |
|---|---|---|---|
| | නිරීක්ෂණ වලට යටත් ව ක්‍රියාත්මක කිරීමට 2024 ජනවාරි 25 දින අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. ඒ අනුව නව මාර්ග මෙම වැඩසටහනට ඇතුළත් නොකළ යුතු බව සඳහන් වුවද එයට පටහැනිව අධිකාරියට අයත් නොවන නව මාර්ග කි.මී 973.5 ක් සංවර්ධනය කිරීම ආරම්භ කර තිබුණි. | | උපදෙස් නිකුත්කර අධීක්ෂණය යුතුය. |
| (සa) | අධිකාරියේ විෂය පථයට අයත් නොවන මාර්ගයක පිහිටි කින්නියා - කුරුන්වන්කර්නි මාර්ගයේ පාලම් අංක 01 (කුරුවන්කර්නි පාලම) මාර්ග කිලෝමීටර් 100,000 ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 227.7 කට පිරිනමා 2022 අගෝස්තු 25 දින වන විට සියයට 25 ක භෞතික ප්‍රගතියක් සඳහා කොන්ත්‍රාත්කරුට රු.මිලියන 60.6 ක් ගෙවා තිබුණි. තවද, 2024 ජනවාරි 31 දින තාවකාලික යකඩ පාලමක් ඉදිකර ගමනාගමනය පහසුකම් සැලසීමට මෙම ව්‍යාපෘතිය යටතේ හා අධිකාරියේ RMT අරමුදල මඟින් එකතුව වූ රු.මිලියන 13.504 ක පිරිවැයක්ද දරා තිබුණි. ඒ අනුව, අධිකාරියේ විෂය පථයට පරිබාහිරව මෙම පාලම සහ විකල්ප ප්‍රවාහන කටයුතු සැලසීම වෙනුවෙන් දරන ලද රු.මිලියන 74.104 ක වටිනාකම අනුමැතියකින් තොරව දරන ලද වියදමක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය. | මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතියට අනුමත ප්‍රතිපාදන තුල ක්‍රියාකාරී අයවැය (Activity Budget) යටතේ කින්නියා - කුරුන්වන්කර්නි මාර්ගයේ පාලම් අංක 01 (කුරුවන්කර්නි පාලම) ඉදිකිරීම සඳහා, ඉදිකිරීම් අංශය මඟින් කොන්ත්‍රාත් ප්‍රදානය කොට ආරම්භ කර ඇත. | අධිකාරියේ විෂයපථයට ඇතුළත් නොවන මාර්ග ඉදිකිරීමට කටයුතු නොකළ යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ) ඡේදය යටතේ වූ සමාලෝචනයේදී කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ විශේෂ අවධානය යොමුකර අවශ්‍ය පරිපාටීන් හඳුන්වා දී ලිඛිත උපදෙස් නිකුත්කර අධීක්ෂණය කළ යුතුය. |
| (සaa) | මාර්ග කිලෝමීටර් 100,000 ව්‍යාපෘතිය යටතේ පළාත් 09 ක කොන්ත්‍රාත් 29 ක් සඳහා ලබා දුන් රු.මි 245.8 ක් වැඩ පූර්ව අත්තිකාරම් සඳහා කොන්ත්‍රාත්කරුවන් විසින් ලබා දුන් බැඳුම්කර 2021, 2022 සහ 2023 වර්ෂ වල දී කල් ඉකුත් වී තිබුණද මෙම කල් ඉකුත් වූ වැඩ පූර්ව අත්තිකාරම් වල බැඳුම්කර කාලය ඉකුත්වීමට පෙර කාලය දීර්ඝකර ගැනීමට කටයුතු කර නොමැතිවීම හේතුවෙන් අදාළ අත්තිකාරම් අයකර ගැනීමේ අවධානමක් පැවතියද, ඊට අදාළ හානිකරන අලාභ වෙන්කිරීමට හා වගකීම් පැහැරහැර ඇති නිළධාරීන් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට අධිකාරිය විසින් කටයුතුකර නොතිබුණි. | දෙන ලද අත්තිකාරම් මුදල් වෙනුවෙන් ලබා දෙන ලද අත්තිකාරම් සුරක්ෂිත යාවත්කාලීන කිරීම් සිදු කරන ලදී. කල්ඉකුත්වූ අත්තිකාරම් සුරක්ෂිත දීර්ඝ කරන ලෙසත් එසේ නොකරන්නේ නම් එම වටිනාකම මුදලින් අධිකාරිය වෙත ලබා දෙන ලෙස අදාළ පාර්ශව දැනුවත් කර ඇත. අත්තිකාරම් සුරක්ෂිතයන්හි කල් ඉකුත් වීම් සිදු වීමට පෙර අදාළ පළාත් කාර්යාල ප්‍රධානීන් විසින් (පලාත් භාර අධ්‍යක්ෂ / ප්‍රධාන ඉංජිනේරු) මෙම සුරක්ෂිතයන්හි කාලය දීර්ඝ කරන ලෙසත්, එසේ නොකරන්නේ නම්, එම | ආයතන සංග්‍රයේ II කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | වටිනාකම මුදල්මය වශයෙන් එම කාල වකවානුව තුල රටෙහි පැවැති කොවිඩ් 19 හේතුවෙන් හා මූල්‍ය අර්බුදය හේතුවෙන් අත්තිකාරම් බැදුම්කර ලබා දී ඇති මූල්‍ය ආයතන මෙම කරුණ සම්බන්ධයෙන් ක්‍රියාකර නොමැත. | |
| (එ) | මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතිය මගින් කොන්ත්‍රාත් පැකේජයන්ට අදාළ ඉංජිනේරු ඇස්තමේන්තුව පිරිවැයට සියයට 20 ක් එකතුකර ඒම වටිනාකම මත සියයට 4.2 ක පරිපාලන පිරිවැයක් සහ සියයට 10 ක අසම්භාව්‍යන් සඳහා ප්‍රතිශතයක් ලෙස පිරිවැයට සියයට 30 කට වැඩි අගයක් එකතුකර ලංසුකරුට ඉදිරිපත් කර ඒ සඳහා උපරිම වට්ටමක් ලබා දීමේ ක්‍රමය අනුගමනය කර තිබුණි. ඒ අනුව, තෝරා ගත් කොන්ත්‍රාත් පැකේජ 24 ක් සඳහා අදාළ ලංසුකරුවන් විසින් ලබා දී තිබූ වට්ටම් ප්‍රමාණය සියයට 0.19 සිට සියයට 13.56 දක්වා අවම පරාසයක පැවතුණි. අදාළ ඉංජිනේරු ඇස්තමේන්තු ප්‍රසිද්ධ නොකර මිල කැඳවීම් හරහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සිදු කළේ නම් අස්ථිත්වයට වට්ටම් මඟින් හිමි වූ ප්‍රතිලාභයට වඩා වැඩි වාසිදායක තත්ත්වයක් ලබාගත හැකිව තිබුණු බව නිරීක්ෂණය විය. තෝරා ගත් පැකේජ 11ක ඉංජිනේරු ඇස්තමේන්තු සලකා බැලීමේ දී සමස්ථ ලාභයෙන් සියයට 12 ක එනම් රු.මිලියන 11.47 ක වට්ටමක් අධිකාරියට ලැබෙන විට සියයට 88 ක් එනම් රු.මිලියන 83.13 ක ලාභයක් කොන්ත්‍රාත්කරුවන්ට උපයා ගැනීමට අවස්ථාව සැලසී තිබුණි. | කි.මී. 100,000 ව්‍යාපෘතිය සඳහා ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීමේදී HSR රේටයන්ට 20% ක පොදු කාර්ය හා ලාභාංශ එකතු කොට සාදා ඇත.<br>මෙම කොන්ත්‍රාත් ප්‍රදානයන් සිදු කර ඇත්තේ කොන්ත්‍රාත් ප්‍රදානය කරනු ලබන සම්මත ක්‍රමවේදයක් වන Lump Sum ක්‍රමවේදය යටතේය. එහිදී සෑම විටම ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා අඩු අගයකට කොන්ත්‍රාත් ප්‍රදානය සිදු කර ඇත.<br>මැනුම් කර ගෙවීමේ ක්‍රමවේදය (measure and pay) හරහා සිදු කරන කොන්ත්‍රාත් ප්‍රදානයන් සඳහා ඉංජිනේරු ඇස්තමේන්තු අගයට වඩා වැඩි අගයන් වෙත ප්‍රදානය කිරීමේ සම්භාවිතාවය ඉතා ඉහළය.<br>එනමුත්, කි.මී. 100,000 ව්‍යාපෘතිය යටතේ වට්ටම් ලබා දීම සිදු කළ බැවින්, ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා අඩු අගයකට කොන්ත්‍රාත් ප්‍රදානය සිදු කර ඇත. මෙම ක්‍රමවේදය මඟින් ප්‍රසම්පාදන අස්ථිතයට සාමාන්‍යයෙන් හිමිවන ප්‍රතිලාභයට වඩා වැඩි වාසිදායක තත්ත්වයක් පවතී. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ) ඡේදය යටතේ වූ සමාලෝචනයේදී මෙම ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂ අවධානය යොමුකර අවශ්‍ය පරිපාටීන් හඳුන්වා දී ලිඛිත උපදෙස් නිකුත්කර අධීක්ෂණය කළ යුතුය. |
| (ඒ) | වටිනාකම රු.මිලියන 50 ට අඩු කොන්ත්‍රාත් පැකේජ වලට අදාළව ඇස්ෆෝල්ට් ඇතිරීම සඳහා වෙනත් කොන්ත්‍රාතකරුවකු වෙත කෝත්‍රාත් ප්‍රධානය කරන බව සඳහන්කර තිබුණු අතර ඒ ආකාරයට දිස්ත්‍රික්ක 22 ක ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්වලින් ABC ඇතිරීම 100% ක් සම්පූර්ණ කරන | වටිනාකම රු. මිලියන 50 ට අඩු කොන්ත්‍රාත් පැකේජ වලට අදාළ ඇස්පෝල්ට් ඇතිරීම වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු හරහා සිදු කර ගැනීමට ව්‍යාපෘතිය ආරම්භයේදීම තීරණය කර ඇති අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියද ලබා තිබුණි. නමුත් | ආයතන සංග්‍රයේ II කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලද එහෙත් ඇස්ෆෝල්ට් ඇතිරීම සිදුකරන ලද මාර්ග වලට අදාළව 2024 සැප්තැම්බර් 30 දිනට භෞතික ප්‍රගතිය 80% ට වඩා අඩුවෙන් වාර්තා කරන ලද මාර්ග 405 ක් පැවති අතර එම දුර ප්‍රමාණය කි.මී. 591.03 ක් වී තිබුණි. ඒ අනුව, ABC ඇතිරීම සම්පූර්ණ කරන ලද නමුත් මෙම මාර්ග ඉදිකිරීම් අවසන් නොකිරීම හේතුවෙන් එම මාර්ග හානි වීම් සිදු වීමෙන් පළමු අධියර යටතේ ABC 100% ක් සම්පූර්ණයෙන් ඇතිරීම සඳහා දරන ලද වියදම නිශ්කාර්ය වියදම් බවට පත් වන බව නිරීක්ෂණය විය. | 2020, 2021 සහ 2022 වසර තුල ඇතිවූ කොවිඩ් 19 වසංගතය හා ඊට සමගාමීව ඇති වූ රටේ ආර්ථික අර්බුදය හමුවේ සිදුවූ අමුද්‍රව්‍ය හිගකම, ඇතැම් අමුද්‍රව්‍ය වල මිල උච්චාවචනය යන ආදී කරුණු හේතුවෙන් ව්‍යාපෘති වලට අදාළ ඇස්පෝල්ට් සැපයීම සිදු කර ගැනීමට නොහැකි වීම සහ ගෙවීම් කටයුතු නියමිත කාල සීමාවන් තුල සිදු කර ගැනීමට නොහැකි වීම යන කරුණු මත ව්‍යාපෘතින් වල ප්‍රගතිය මූලිකව සැලසුම් කළ ආකාරයට ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. | |
| (ඓ) | රේඛීය අමාත්‍යාංශය 2025 අප්‍රේල් 04 දින පවත්වන ලද විගණන කළමනාකරණ කමිටු රැස්වීම් සටහන් අංක 03 (iii) පරිදි කි.මී 100,000 ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් 34 ක් සඳහා අය කිරීමට නියමිත වැඩ පූර්ව අත්තිකාරම් වටිනාකම රු.මිලියන 340.20 ක් සඳහා අධිකාරියේ නීති අංශය මගින් අවශ්‍ය කටයුතු සිදු කරනු බව සඳහන් කර තිබුණද, 2025 මැයි 02 වන වටත් නීති අංශය සතුව අවශ්‍ය තොරතුරු නොමැති වීමත් එවැනි නීතිමය ක්‍රියාමාර්ග ගැනීමක් සිදු කර නොමැති බව විගණනය වෙත නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (නීති) විසින් අංක RDA/LD/LBF&RRP හා 2025 අප්‍රේල් 30 දිනැති ලිපිය මගින් දන්වා ඇත. ඒ අනුව වැඩ පූර්ව අත්තිකාරම් අයකර ගැනීමේ අවධානමක් පවතින බව නිරීක්ෂණය විය. | කි.මී100,000 .ව්‍යාපෘතියේ වැඩ පූර්ව අත්තිකාරම් ලෙස අයකර ගැනීමට ඉතිරිව ඇති මුදල සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අදාළ පියවර ගෙන ඇත. කොන්ත්‍රාත්වලට අදාළව ඉතිරිව ඇති අත්තිකාරම් ප්‍රමාණය අඩුකර ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුවන් වෙනුවෙන් වැඩ ප්‍රමාණයක් ලබාදී එම මුදල අඩුකර ගැනීම සඳහා සාකච්ඡා සිදු කර ඇත. | අදාළ අත්තිකාරම් මුදල් පියවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොපමාව ගත යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 නොවැම්බර් 12 දිනට දකුණු පළාත තුළ තනතුරු 07 ක අතිරික්ත නිලධාරීන් 215 ක් ද, තනතුරු 05 ක නිලධාරීන් 18 දෙනෙකුගේ පුරප්පාඩුද පැවති නමුත් අතිරික්ත නිලධාරීන් වෙනත් සේවා ස්ථානයකට මාරු කිරීමට / අනුයුක්ත කිරීමට හෝ පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබීම තුළ මානව සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කර නොතිබූ බැවින් අතිරික්ත නිලධාරීන් වෙත ගෙවන ලද වැටුප් හා දීමනා නිෂ්කාර්ය වියදම් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය. | 2025 වර්ෂික ස්ථාන මාරු යටතේ දකුණු පළාත තුල සිටින අතිරික්ත නිලධාරීන්/ සේවකයින් පුරප්පාඩු පවතින කාර්යාල වෙත ස්ථාන මාරු කිරීමට කටයුතු කරන ලදී. එහිදී, වසර 5 කට වඩා වැඩි කාලයක් එකම සේවා ස්ථානයක සේවා කාලයක් සම්පූර්ණ කළ නිළධාරීන් / සේවකයින් සේවා අවශ්‍යතාවය ද සලකා බලා ස්ථාන මරු කිරීමට කටයුතු කර ඇත. | සේවක අවශ්‍යතාවය අනුව අනුමත කාර්යමණ්ඩලයක් පවත්වා ගැනීමට ගණන් දීමේ නිලධාරී කටයුතු කළ යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ) ඡේදය යටතේ වූ සමාලෝචනයේදී මෙම ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂ අවධානය යොමුකර අවශ්‍ය පරිපාටීන් හඳුන්වා දී ලිඛිත උපදෙස් නිකුත්කර අධීක්ෂණය කළ යුතුය. |
| (ආ) | 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පිහිට වූ පනත අනුව අධිකාරියට පැවරී ඇති කාර්යභාරය වූ මාර්ග ඉදිකිරීම්, වත්කම් මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා පළාත් අධ්‍යක්ෂ කාර්යාල, ප්‍රධාන ඉංජිනේරු කාර්යාල, විධායක ඉංජිනේරු කාර්යාල සහ ප්‍රාදේශීය වැඩ ඒකක පිහිටුවා එම ඒකක වෙත අවශ්‍ය නිලධාරීන් බඳවා ගෙන අනුයුක්ත කර තිබියදී, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව බස්නාහිර පළාත් ව්‍යාපෘති කාර්යාලය, දකුණු පළාතේ අතිරේක අධ්‍යක්ෂ ඉදිකිරීම් කාර්යාලය, වයඹ පළාතේ ප්‍රධාන ඉංජිනේරු ව්‍යාපෘති කාර්යාලය සහ සබරගමුව පළාතේ රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රධාන ඉංජිනේරු ව්‍යාපෘති කාර්යාල පිහිටුවා එම කාර්යාල සඳහා 2021, 2022 හා 2023 යන වර්ෂයන්හිදී පිළිවෙලින් සේවකයින් 91 ක්, 85 ක් හා 81 ක් අනුයුක්ත කර එම වර්ෂවල සේවක වැටුප් හා අනෙකුත් වියදම්, වාහන කුලී ඇතුළු නඩත්තු හා මෙහෙයුම් වියදම් සඳහා පිළිවෙලින් රු.මිලියන 213.96 ක්, රු.මිලියන 186.073 ක් හා රු.මිලියන 120.613 ක් වැයකර තිබුණි. | රජය විසින් කලින් කළට ආරම්භ කරන ලද නව සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහාත්, මාර්ග සංවර්ධන අධිකාරියේ ආයතනික කටයුතු සුමටව පවත්වාගෙන යාම සඳහාත් අවශ්‍ය අවස්ථාවන්හිදී පමණක් කාර්යාලවල අවශ්‍යතාවය අනුව එම කාර්යාල පිහිටුවීමට කටයුතු කර ඇත. මාර්ග සංවර්ධන අධිකාරිය තුල පවතින තනතුරු සඳහා අනුමත සමස්ථ කාර්ය මණ්ඩලය අතරින් සේවා අවශ්‍යතාවය මත රේඛීය අමාත්‍යාංශයේ සහ ව්‍යාපෘති ප්‍රධානීන් විසින් කරන ලද ඉල්ලීම්ද සැලකිල්ලට ගනිමින් අවම සේවක සංඛ්‍යාවක් එම ව්‍යාපෘති වෙත අනුයුක්ත කිරීමට මෙම අධිකාරිය විසින් පියවර ගෙන ඇත. | දේශීය හා විදේශීය ව්‍යාපෘති සඳහා අධිකාරියේ සේවකයින් නිදහස් කිරීම සම්බන්ධයෙන් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ) ඡේදය යටතේ වූ සමාලෝචනයේදී විශේෂ අවධානය යොමුකර අවශ්‍ය පරිපාටීන් හඳුන්වා දී ලිඛිත උපදෙස් නිකුත් කර අධීක්ෂණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2007 අගෝස්තු 01 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 36 අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්ය මණ්ඩය තුළ පමණක් සේවක බඳවා ගැනීම් සිදු කළ යුතු වුව ද, එයට පටහැනිව අධිකාරිය සේවක බඳවා ගැනිම් සිදු කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 9474 ක් හා 9274 ක් වී සේවක අතිරික්තය 477 ක් හා ඌනතාවය 677 ක් තිබුණි. එම අතිරික්ත සේවක සංඛ්‍යාව තුළ කොන්ත්‍රාත් පදනම මත වසරක සේවා කාලයකට මධ්‍යම අධිවේගී මාර්ගය අදියර 2 මෙහෙයුම් කටයුතු සඳහා සේවකයින් 105 ක් බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2023 මාර්තු 22 වන දින මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලැබී තිබුණි. ඒ අනුව අදාළ කොන්ත්‍රාත් කාලය 2024 මාර්තු 21 දිනෙන් අවසන් වුවද, එම කාලය දිර්ඝ කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට හෝ සේවා අවශ්‍යතාවයක් නොමැති සේවකයින්ගේ කොන්ත්‍රාත් සේවා කාලය අවසන් කිරිමට අධිකාරිය කටයුතු කර නොතිබුණි. | මධ්‍යම අධිවේගී මාර්ගයේ අදියර 2 හි මෙහෙයුම් කටයුතු සඳහා සේවකයින් බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2023 මාර්තු 22 වන දින මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලැබී තිබුණු නමුත් එම දෙපාර්තමේන්තුවේ අංක: DMS/7777/CEP දරන ලිපිය මගින් ඔවුන්ගේ කොන්ත්‍රාත් සේවා කාලය දීර්ඝ කර නොමැත. එහෙත් එම සේවකයින් 105 දෙනාගේ සේවා කාලය අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක: 2523/2023 ට අනුව දීර්ඝ කර ඇත. | ආයතන සංග්‍රයේ II කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව පරීක්ෂණයක් සිදුකර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමතියෙන් තොරව බඳවා ගැනීම් සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ) ඡේදය යටතේ වූ සමාලෝචනයේදී මෙම ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂ අවධානය යොමුකර අවශ්‍ය පරිපාටීන් හඳුන්වා දී ලිඛිත උපදෙස් නිකුත්කර අධීක්ෂණය කළ යුතුය. |
| (ඇ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් තනතුරු හා වැටුප් පරිමාණය අනුමත කර නොගත් තනතුරු 07 ක් සඳහා නිලධාරීන් 19 දෙනකු බඳවා ගෙන වැටුප් හා දීමනා ලෙස රු.මිලියන 14.04 ක් සමාලෝචිත වර්ෂයේ දී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ගෙවීම්කර තිබුණි. | සේවා අවශ්‍යතාවය මත එවකට සිටි කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවුනු හෙයින් අවශ්‍ය අවස්ථාවන්හීදී එවකට සිටි කළමනාකාරීත්වය විසින් සේවක සංඛ්‍යාව ඒ ඒ තනතුරු සඳහා බඳවාගෙන ඇත. | ආයතන සංග්‍රයේ ii කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව පරීක්ෂණයක් සිදුකර කළමනාකරණ සේවා දෙපාර්ථමේන්තුවේ අනුමතියෙන් තොරව බඳවා ගැනීම් සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ) ඡේදය යටතේ වූ |

| | | |
|---|---|---|
| | | සමාලෝචනයේදී මෙම ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂ අවධානය යොමුකර අවශ්‍ය පරිපාටීන් හඳුන්වා දී ලිඛිත උපදෙස් නිකුත්කර අධීක්ෂණය කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියට අයත් සී/ස අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සමාගම 2016 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම මහ නැගුම ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සමාගමේ 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය හැර ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ විගණන මතය ව්‍යාවනය කර තිබූ අතර 2022 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අහිතකර විගණන මතයක් ලබා දී තිබුණි. 2023 මාර්තු 20 දිනැති අංක CP/23/0394/608/033 දරන අමාත්‍ය මණ්ඩල තිරණය අනුව අධිකාරිය සතු පාලිත සමාගම් 04 ඇවර කිරීමට තීරණය කර තිබීම හේතුවෙන් අදාළ සමාගම්වල අඛණ්ඩ පැවැත්මද අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි. | එකඟ වී ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ) ඡේදය යටතේ වූ සමාලෝචනයේදී පරිපාලිත සමාගම් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකර එම සමාගම්වල අඛණ්ඩ පැවැත්ම, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා විගණනය වෙත ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් උපදෙස් නිකුත් කර අධීක්ෂණය කළ යුතුය. |

## 4.2 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2024 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ තිරසර සංවර්ධන ඉලක්කයන් සපුරා ගත හැකි වන ආකාරයෙන් වැඩ පිළිවෙලක් නිරූපනය නොවූ අතර අධිකාරිය විසින් හඳුනාගත් තිරසර සංවර්ධන ඉලක්ක යටතේ ඉටු කිරීමට සැලසුම් කර ඇති ව්‍යාපෘතින් මොනවාද යන්නත්, ඊට අදාළ තිරසර සංවර්ධන දර්ශකයන් (SDG Indicators) සහ වර්ෂය තුළ දී එම දර්ශකයන්ගේ අපේක්ෂිත කාර්ය සාධනය වැනි නිර්ණායක වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත නොවුණි. එමෙන්ම 2030 වර්ෂය දක්වා ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසාර අරමුණු මොනවාද යන්නත් හඳුනාගෙන නොතිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරිය මගින් තිරසර සංවර්ධන ඉලක්ක සඳහා තිරසර සංවර්ධන සභාව වෙත ලබා දිය යුතු දර්ශකයන්, 2023 වර්ෂය වන තෙක් ලබා දී ඇත. එම ඉලක්ක හා දර්ශකයන් යාවත්කාලීන කරන ලදී. යාවත්කාලීන කරන ලද ඉලක්ක වනුයේ 11.2 සහ 9.1 ය. සෑම ව්‍යාපෘතියක් තුලින්ම එම ඉලක්ක සපුරා ගැනීම සිදු වන අතර, තිරසර සංවර්ධන ඉලක්ක සඳහා දක්වා ඇති අංශයන් මගින් ඊට අදාළ දත්ත වාර්ෂිකව ලබාදෙනු ඇත. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ තිරසර සංවර්ධන ඉලක්ක නිරූපනය කළ යුතු අතර, 2030 වර්ෂය දක්වා ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසාර අරමුණු හඳුනාගත යුතුය. |